ලංකා විදුලිබල මණ්ඩලය - 2019

---

## 1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකා විදුලිබල මණ්ඩලයේ සහ එහි පරිපාලිත සමාගම්වල 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා විදුලිබල මණ්ඩලයේ හා එහි පරිපාලිත සමාගම්වල ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ("සමූහය") ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. එල්ටීඑල් හෝල්ඩින්ස් ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන අදාළ පරිපාලිතයේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් විගණනය කරන ලදි.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දිනට සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සමූහය විසින් සමූහයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

---------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි නියෝජනය හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස සමූහයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, මණ්ඩලයේ හෝ සමූහයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමූහයේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල්කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ මණ්ඩලයේ හා සමූහයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ හා සමූහයේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය හා සමූහය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව මණ්ඩලය හා සමූහය කටයුතු කර ඇති බව,

- මණ්ඩලයේ හා සමූහයේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 ඒකාබද්ධ කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මා විසින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පහත සමාගම්වල මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ විගණන මතයන් පහත නිරීක්ෂණ මත පදනම්ව ප්‍රකාශ කරන ලදි. | | |
| (අ) ලංකා කෝල් කම්පැණි ප්‍රයිවට් ලිමිටඩ් (සමාගම) | | |
| i. දේපල පිරියත සහ උපකරණ පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 16) 51 වන ඡේදයට අනුව, වත්කම් වල ප්‍රයෝජනවත් ආයු කාලය අවම වශයෙන් එක් එක් මූල්‍ය වර්ෂය අවසානයේදී සමාලෝචනය කළ යුතු අතර අපේක්ෂාවන් පෙර ඇස්තමේන්තුවලට වඩා වෙනස්නම්, එම වෙනස්කම් LKAS 8 ට අනුකූලව ගිණුම්කරණය කළ යුතුය. කෙසේ වෙතත්, තවමත් භාවිතයේ පවතින සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති මෝටර් වාහන වල ප්‍රයෝජනවත් ආයු කාලය සමාලෝචනය කර ඒ අනුව ගිණුම්කරණය කර නොතිබුණි. | සමාගමට අයත් සම්පූර්ණයෙන්ම ක්ෂය වූ වාහන 3 ක් සඳහා සහතික කළ තක්සේරුවක් ගෙන 2020 මූල්‍ය වර්ෂය තුළ දී අවශ්‍ය ගැලපීම් කරනු ලැබේ. | ගිණුම්කරණ ප්‍රමිති සමඟ අනුකූලවීමට අවශ්‍ය පියවර ගන්න. |

| | | | |
|---|---|---|---|
| ii. | ආදායම් බදු පිළිබඳ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 12) 88 වන ඡේදයට අනුව, 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු (ESC) සම්බන්ධව රු.159,549,619ක් වන තක්සේරුව සම්බන්ධයෙන් සහ රු. 75,461,644 ක මුදලකට පනවා ඇති දඩ මුදල් සම්බන්ධයෙන් සලකා බලන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල කිසිදු හෙළිදරව් කිරීමක් කර නොතිබුණි. තවද, සමාලෝචිත වර්ෂය අවසානයේ ගෙවිය යුතු මුළු ආර්ථික සේවා ගාස්තුව රු. 579,179,232 ක් විය. නිසිපරිදි සංශෝධනය කරන ලද 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 6 වන වගන්තියට අනුව, කාර්තුව අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ 20 වන දින හෝ ඊට පෙර ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය දක්වාම සමාගම විසින් ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තු ගෙවා නොතිබුණි. | ආර්ථික සේවා ගාස්තු නිරවුල් කිරීමට දීර්ඝ කිරීමක් ඉල්ලා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවා ඇති අතර ආර්ථික සේවා ගාස්තු ගෙවීම සම්බන්ධව සුහදශීලී ගිවිසුමක් ඇති කර ගන්නා තුරු මේ සම්බන්ධයෙන් සමාගමට එරෙහිව යම් ගාස්තු පැනවීම හෝ අය කර ගැනීමේ කිසිදු ක්‍රියාමාර්ගයකින් වළකින ලෙස ද ඉල්ලීමක් කර ඇත. | දඩ ගෙවීම්වලින් වැළකීමට නියමිත දිනට පෙර වගකීම් පියවිය යුතුය. |
| iii. | ආදායම සම්බන්ධ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ (LKAS 18) 14 වන ඡේදයට අනුව භාණ්ඩ අළෙවියෙන් ලැබෙන ආදායම හඳුනාගෙන නොමැත. ගල් අඟුරු ආනයනය කරන විට, රේගු අරමුණ සඳහා වටිනාකම නිශ්චය කිරීමේදී ආරෝපිත ගැලපුමක් ලෙස සියයට 10 ක මිල අධිකයක් රේගු අවස්ථාවේ වටිනාකමට එකතු කරනු ලැබේ. කෙසේ වෙතත්, සමාගම රු.3,804,035,310 ක් වටිනා ආරෝපිත සියයට 10 ක මිල අධිකයක් ආදායමට එකතු කර තිබුණු අතර පසුව සමාගම එම වටිනාකම ණය ගැතියන්ට වට්ටමක් ලෙස ලබා දී විකුණුම් පිරිවැයට අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස විකුණුම් පිරිවැය හා ආදායම සමාන ප්‍රමාණයකින් වැඩි වී තිබුණු අතර ඒ සඳහා අතිරේක ආර්ථික සේවා ගාස්තු ගෙවීමට සිදු විය. | මණ්ඩලය වෙත එකතු කළ අගය මත බදු ඉන්වොයිසි නිකුත් කිරීමේදී පිරිවැයට රේගු ආන්තිකය එකතු කරන ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව (IRD) විසින් සමාගම වෙත නියෝගයක් ලබා දෙන ලදි. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ (IRD) නිලධාරියකුගේ සහභාගීත්වයෙන් 2018 ජූනි 28 දින අමාත්‍යාංශයේ පැවති රැස්වීමකින් අනතුරුව මෙම මිලකරන යාන්ත්‍රණය අනුගමනය කරන ලදි. මණ්ඩලය වෙත නිකුත් කරන ඉන්වොයිසි මත එකතු කළ අගය මත බද්ද සඳහා සමාගමේ මූලික වටිනාකම රේගු අරමුණු සඳහා වන වටිනාකමට වඩා අඩු විය නොහැකි බව දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරියා ප්‍රකාශ කර වාර්තා ගත කර ඇත.<br>එබැවින් සියයට 10 යන්න සම්පූර්ණයෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තු නිලධාරීන්ගේ නියෝගය මත එකතු කරනු ලැබේ. එතැන් පටන්, මණ්ඩලය විසින් මෙම | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වල අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්තා පවත්වා ගත යුතුය. |

| | | |
|---|---|---|
| | නියෝගයට අභියෝග කර 2018 සැප්තැම්බර් 07 දිනැති එහි ලිපියෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට දන්වා ඇති අතර එයට ප්‍රතිචාරය ලැබීමට නියමිතය. එතෙක්, අපි ඉන්වොයිසියට සියයට 10 ක රේගු ආන්තිකය එකතු කළ නමුත්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රීතියක් **(Ruling)** නිකුත් කිරීම අපේක්ෂාවෙන් සිටින අතර වාරයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කිසිදු එකතු කළ අගය මත අධි නිමැවුම් බද්දක් ප්‍රේෂණය කර නැත. එබැවින්, ආදායම පැහැදිලිව වැඩියෙන් ප්‍රකාශ වීම සඳහා හේතුව එය වේ. | |
| iv. 2016 සැප්තැම්බර් 19 සිට 2018 අප්‍රේල් 9 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ගල් අඟුරු වල නිවැරදි ගණුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් නොකිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රේගුව විසින් සමාගමට රු.205,000,000 ක දඩයක් පනවා තිබුණි. සමාගම මෙම දඩ ගෙවීම, ශ්‍රී ලංකා රේගු වැට් ගිණුමට රු.155,426,118 ක වටිනාකමක්, වැට් පාලන ගිණුමට රු.39,970,418 ක වටිනාකමක් හා සී.එස්.සී.එල් වගකීම් ගිණුමට රු.9,603,464 ක වටිනාකමක් වැරදි ලෙස හර කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, වියදම් රු. 205,000,000 කින් අඩුවෙන්ද, වත්කම් රු.195,396,536 කින් වැඩියෙන් දක්වා තිබූ අතර වගකීම් රු.9,603,464 කින් අඩුවෙන් දක්වා තිබුණි. තවද, සමාගම විසින්, මණ්ඩලයෙන් ලැබිය යුතු සහ වැට් සම්බන්ධයෙන් ගෙවිය යුතු රේගු වැට් ලෙස එකතුව රු.126,956,898 ක් වැට් ලෙජරයේ වාර්තා කර තිබුණි. කෙසේ වුවද, මෙම වටිනාකම සත්‍යාපනය කිරීමට ආධාරක ලේඛන හා සාධාරණ හේතු ලබා දී නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව විසින් කරන ලද විමර්ශනයකට අනුව ලංකා ගල් අඟුරු සමාගම 2016.09.19 සිට 2018.04.09 දක්වා කාලය තුළ ආනයනය කරන ලද ලංකා ගල් අඟුරු වල නිවැරදි ගණුදෙනු වටිනාකම ප්‍රකාශයට පත් කර නොමැත. එම කාලය තුළ, ලංකා නැව් සංස්ථාව විසින් එක් නැව්තොග **(Shipment)** කිරීමක් සඳහා රු.1,000,000 ක ගාස්තුවක් වෙනුවෙන් රේගු ප්‍රකාශ කිරීම සම්පූර්ණයෙන් මෙහෙයවා ඇත. ඉහත වැරදි ප්‍රකාශය මත ශ්‍රී ලංකා රේගුව රු.205,000,000 ක දඩයක් සමාගමට පනවා ඇති අතර ශ්‍රී ලංකා රේගුවේ විමර්ශන නිලධාරීන් සමාගමේ නිලධාරීන්ට දන්වා ඇත්තේ මෙම ගෙවීමෙන් පසු කිසිදු අවසන් එකතු කළ අගය මත බදු ගෙවීමක් නොකළ යුතු බවයි.<br><br>සමාගම දැනටමත් අදාළ නැව්තොග සඳහා රු.37,594,744 ක් එකතු කළ අගය මත බදු ලෙස ගෙවා තිබුණු අතර ශ්‍රී ලංකා රේගුව ගල් අඟුරු නැව් තොග නිෂ්කාශනය කළ නිසා, මණ්ඩලය විසින් සපයන අරමුදල් භාවිතා කරමින් පසු කාලීනව රු.මිලියන 205 ක වටිනාකමක් පියවීමට සිදුවුණි.<br>කෙසේ වෙතත්, සමාගම, ප්‍රතික්ෂේප කරන ලද එම දඩය ඉවත් කරන ලෙස | ගැටලුව විසඳීම සඳහා ඉක්මන් ක්‍රියාමාර්ග ගතයුතු අතර ගැටලුව සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනාගත යුතුය. |

| | | |
|---|---|---|
| | ඉල්ලමින් රේඛීය අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශයට මෙම කාරණය ලිඛිතව දන්වා ඇත. නමුත්, මෙම කාරණය මණ්ඩලය සහ සීඑස්සී සම්බන්ධ අමාත්‍යාංශවල ලේකම්වරුන් දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් විසින් ( නෙම්මාවත්ත කමිටුව) විමර්ශන කටයුතු කරනු ලබන අතර මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි ඉදිරිපත් කිරීමක් කිරීමට ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී. | |
| **v.** සමාගම, ඉහත **iv** කොටසේ සඳහන් කරන ලද දඩය ගෙවීමට සහ නැව්තොග බිල්පත් පියවීම වෙනුවෙන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය පවා ලබාගැනීමෙන් තොරව, මණ්ඩලයෙන් ලැබුණු අරමුදල් භාවිතා කර තිබුණු අතර පාඩු සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට විධිමත් පරීක්ෂණයක් කර නොතිබුණි. | ශ්‍රී ලංකා රේගුව ගල් අඟුරු නැව්තොග නිශ්කාෂණය නතර කර තිබූ නිසා සමාගම මණ්ඩලයෙන් දෙන ලද අරමුදල් භාවිතා කරමින් ගෙවීම් කරන ලදි. මෙම කාරණය මණ්ඩලය සහ සීඑස්සී සම්බන්ධ අමාත්‍යාංශවල ලේකම්වරුන් දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් (නෙම්මාවත්ත කමිටුව) විසින් විමර්ශන කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී. | ගැටලුව සඳහා වගකිව යුතු පුද්ගලයන් හඳුනා ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| **vi.** කෙටිකාලීනව ගල් අඟුරු බෙදා හැරීම සම්බන්ධයෙන් සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් (**CSCL**) හරහා තෝරියන් අයන් සහ ස්ටීල් කම්පැණි ලිමිටඩ් (**TISCL**) වෙතින් ලැබිය යුතු රු.**539,192,079** ක ශේෂය අය කර ගැනීමට සමාගම අවශ්‍ය ක්‍රියාමාර්ග අරගෙන නොතිබුණි. තෝරියන් අයන් සහ ස්ටීල් කම්පැණි ලිමිටඩ් / සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් විසින් මෙම ශේෂය තහවුරු කර නොමැති අතර ලැබිය යුතු ශේෂය වසර **7** කට වඩා හිඟව පැවතිය ද හානිකරණය සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි. | තෝරියන් අයන් සහ ස්ටීල් නිරවුල් කිරීම ඉහළ මට්ටමේ කමිටුවක් විසින් මෙහෙයවන ලදි. කමිටුව විසින් ණය, බොල් බවට ප්‍රකාශ කර නොමැති අතර ගල් අඟුරු සැපයීමෙන් හිඟ මුදල් පියවීමට සැපයුම්කරු පවා කැමැත්ත පලකර ඇත. අප සතුව ඇති තොරතුරුවලට අනුව, නිරවුල් කිරීමේ යෝජනාවලිය කැබිනට් මණ්ඩලයේ තීරණය සඳහා ඉදිරිපත් කර ඇත. සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් (තෝරියන් අයන් සහ ස්ටීල් කම්පැණි ලිමිටඩ්) වෙතින් ලැබිය යුතු හිඟ මුදල්වල වර්තමාන තත්වය අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කරන ලද අතර තෝරියන් අයන් සහ ස්ටීල් කම්පැණි ලිමිටඩ් සමඟ සාකච්ඡා කිරීම සඳහා කැබිනට් මණ්ඩලය විසින් භාණ්ඩාගාරය (සභාපති), සිලොන් ෂිපින් කෝපරේෂන්, ලක් | ලැබිය යුතු මුදල අය කර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | විජය පවර් ප්ලාන්ට් ආදියෙන් සමන්විත සිවි සාමාජික කමිටුවක් පත් කරන ලදි. තවද, කමිටුවේ නිර්දේශ වරාය හා නාවික අමාත්‍යාංශය හරහා නැවත කැබිනට් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් ලබා දී ඇති අතර එය ඉදිරිපත් කිරීමට නියමිතය. | |
| **vii.** | පසුගිය වසරේ විගණනයේදී සත්‍යාපනය නොවූ, ඉදිරියට ගෙනා ආර්ථික සේවා ගාස්තු (ESC) ලැබිය යුතු මුදල රු. **894,151** ක්, ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (WHT) මුදල රු.**77,719** ක්, ගෙවිය යුතු ආදායම් බදු මුදල රු.**65,474,540** ක්, ලැබිය යුතු ජාතිය ගොඩනැගීමේ බදු (NBT) මුදල රු.**3,371,326** ක් හා ලැබිය යුතු එකතු කළ අගය මත බදු (VAT) මුදල රු. **12,758,801** ක් පෙර වර්ෂ ගැලපීම් ලෙස, **2018** වර්ෂයේ රඳවා ගත් ඉපයීම් වලට එරෙහිව අය කරන ලදි. සමාලෝචනයට භාජනය වූ වර්ෂය අවසාන වන විට පවා මෙම ගැලපීම් නිවැරදි කිරීමට සමාගම අපොහොසත් වී තිබුණි. | ආර්ථික සේවා ගාස්තු / රඳවා ගැනීමේ බදු<br>එකතුව රු.**971,868** ක් ආපසු අය කර ගත නොහැකි ආර්ථික සේවා ගාස්තු / රඳවා ගැනීමේ බදු දීර්ඝ කාලයක් තිස්සේ පවතින අතර තහවුරු නොකළ බදු ශේෂයෙන් කොටසක් කපා හැරීමට මණ්ඩලය වෙතින් ලැබුණු අනුමැතිය විය.<br><br>ආදායම් බදු<br>**14/15** සහ **13/14** යන වර්ෂ සඳහා හිඟ ආදායම් බදු පිළිවෙලින් රු.**2,049,484** ක් සහ රු. **3,590,678** ක් පමණක් බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව ලිඛිතව තහවුරු කරන ලදි. එබැවින්, තවදුරටත් අවශ්‍ය නොවන රු.**11,703,151** ක ගෙවිය යුතු බදු **2018** ජුලි **26** දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව ගලපන ලදි.<br><br>ආදායම් බදු සඳහා රු.**65,474,540** ක අමතර ප්‍රතිපාදනයක් විය. ඉහත සඳහන් කළ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ආදායම් බදු වගකීම පිළිබඳ ලිඛිත තහවුරු කිරීම අනුව මෙය ද තවදුරටත් අවශ්‍ය නොවීය. එබැවින්, අතිරික්ත ප්‍රතිපාදන දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ ලිඛිත තහවුරු කිරීම අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය පරිදි ගෙවිය යුතු ඒවායෙන් ඉවත් කරමින් ආපසු ගලපන ලදි. | දීර්ඝ කාලයක් තිස්සේ හිඟව පවතින ශේෂ සඳහා නිවැරදි ප්‍රතිකර්මය භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| | <u>ජාතිය ගොඩනැගීමේ බදු</u><br>සමාගම විසින් අතීතයේදී ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද ලැබිය යුතු ලෙස ගිණුම්කරණය කරන ලද අතර එය **2017** අවසානයේදී රු. **3,371,326** ක් විය. සමාගම ගල් අඟුරු ආනයන කරුවකු හා වෙළෙන්දෙකු වීම නිසා ගෙවන ලද ජාතිය ගොඩනැගීමේ බද්ද ආපසු අය කර ගැනීමට හිමිකම් නොමැත. එබැවින්, ඉහත ශේෂය ශේෂ පත්‍රයෙන් ගැලපීමට **2018** ජූලි **26** දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ලබා ගන්නා ලදි.<br><br><u>එකතු කළ අගය මත බද්ද</u><br>**2017** අවසානයේ දී ලැබිය යුතු ලෙස ගණන් බලා ඇති රු.**12,758,801** ක යෙදවුම් මත එකතු කළ අගය මත බද්ද නිවැරදි තත්වය නිරූපනය වන ලෙස ගලපන ලදි. යෙදවුම් මත එකතු කළ අගය මත බද්ද ආපසු අය කර ගැනීමේ හැකියාව විමසමින් අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලියා ඇත්තෙමු. දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් **2018** ජුනි **14** දිනැති ලිපියක් මඟින් පැහැදිලි කරන ලද්දේ **2002** අංක **14** දරන එකතු කළ අගය මත බදු පනතේ **22(5)** වගන්තිය ප්‍රකාරව සමාගම විසින් ගෙවන ලද යෙදවුම් මත එකතු කළ අගය මත බද්ද ආපසු නොගෙවිය යුතු බවයි. ඒ අනුව, **2018** ජූලි **26** දින පැවති රැස්වීමේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අවසරය ලබා ගැනීමෙන් ඉහත ලැබිය යුතු ශේෂය ගලපන ලදි. | |
| **viii.** මණ්ඩලය විසින් ගෙවන ලද බත්තල් ගාස්තු වෙනුවෙන් සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් (**CSCL**) වෙත ගෙවිය යුතු රු.**15,870,104** ක එකතු කළ අගය මත බද්ද (නැව් තොග අංක **151** සිට **154**) සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් වෙත ගෙවා හෝ මණ්ඩලයෙන් ලැබුණු අත්තිකරමක් ලෙස ඉදිරිපත් කර | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සැහැල්ලු කිරීම මත ගෙවිය යුතු එකතු කළ අගය මත බද්ද සියයට **0** කරමින් රීති නියමයක් නිකුත් කළ නිසා නැව් තොග අංක **151** සිට **154** දක්වා රු.**15,870,104.32** ක සැහැල්ලු කිරීමේ ගාස්තු මත එකතු කළ අගය මත බද්ද සමාගම සිලෝන් | ගනුදෙනුව සිදු වූ අවසථාවේදී නිවැරදි ගිණුම්කරණ ප්‍රතිකර්මය භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| නොතිබුණි. තවද, ගාස්තුව පියවීම සඳහා මණ්ඩලය වෙතින් අරමුදල් ලබාගෙන තිබුණ ද, සමාගම ඉහත දැක්වූ සැහැල්ලු කිරීම මත එකතු කළ අගය මත බද්ද සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් වෙත ගෙවිය යුතු ලෙස ගිණුම්කරණය කර නොතිබුණි. | සිපින් කෝපරේෂන් වෙත නොගෙවන ලදි. නැව් තොග අංක **124** සිට **142** දක්වා නැව් තොග **11** ක් සඳහා අවසාන එකතු කළ අගය මත බදු තක්සේරුව නිරවුල් කිරීමට මෙම ලැබීම් භාවිතා කරන ලදි. මේ සම්බන්ධයෙන් බැර සටහනක් **2020** දී නිකුත් කර ඇත. | |
| **ix.** ගෙවිය යුතු ගිණුම් වටිනාකම රු. **1,109,063** ක්, මණ්ඩලයෙන් ලැබිය යුතු අවසාන එකතු කළ අගය මත බදු හා වෙනත් ලැබිය යුතු දෑ වටිනාකම රු.**180,416,885** ක් , මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ජික සේවා ගාස්තු වටිනාකම රු. **578,678,686** ක්, මණ්ඩලයට ගෙවිය යුතු වටිනාකම රු.**6,813,692** ක්, සිලෝන් සිපින් කෝපරේෂන් ලිමිටඩ් වෙත පැරණි ගෙවිය යුතු වටිනාකම රු. **28,347,444** ක්, විවිධ ණය ගැතියෝ වටිනාකම රු. **18,075,801** ක්, මණ්ඩලයෙන් ලැබිය යුතු රු. **4,677,509** ක වටිනාකමක්, වෙළඳ ණය ගැති (ලංකා විදුලිබල මණ්ඩලය) ස්ටීම් කොල් වටිනාකම රු. **7,750,000** ක්, මණ්ඩලයෙන් ලැබිය යුතු වෙනත් වටිනාකම රු.**1,760,500** ක්, නෝබල් රිසෝර්සස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ් වෙතින් ලැබිය යුතු වටිනාකම රු. **1,115,987** ක් සහ වෙළඳ ණය හිමියන් - නෝබල් රිසෝර්සස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ් වටිනාකම රු. **85,887,776** ක් සත්‍යාපනය කිරීමට අදාල සාක්ෂි සහ ශේෂ සනාථන විගණනය සඳහා ලබා දී නොමැත. | ගෙවිය යුතු ගිණුම් රු. **1,109,063**<br><br>**2020** වර්ෂයේදී ශේෂය නිවැරදි කරනු ලැබේ.<br><br>මණ්ඩලයෙන් ලැබිය යුතු අවසාන එකතු කළ අගය මත බදු හා වෙනත් ලැබිය යුතු දෑ රු.**180,416,885**<br><br>නැව්තොග **123** සිට **155** දක්වා අවසාන එකතු කළ අගය මත බදු සහ විනිමය අලාභ වෙනුවෙන් ලැබිය යුතු මුදල මෙය වන අතර එය ශ්‍රී ලංකා රේගුවට කරනු ලැබූ රු. මිලියන **205** ක ගෙවීම හා සම්බන්ධ වේ. මෙම කාරණය මණ්ඩලය සහ සීඑස්සී සම්බන්ධ අමාත්‍යාංශවල ලේකම්වරුන් දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් විසින් විමර්ශන කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී. ඉහත වාර්තාවට අනුව සටහන් තබනු ලැබේ.<br><br>මණ්ඩලයෙන් ලැබිය යුතු ආර්ජික සේවා ගාස්තු රු.**78,678,686**<br><br>ආර්ජික සේවා ගාස්තු නිරවුල් කිරීමට කාලය දීර්ඝ කිරීමක් ඉල්ලමින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ලිපියක් යවා ඇත.<br><br>මණ්ඩලයට ගෙවිය යුතු රු. **6,813,692**<br><br>තීරක **(Umpire)** නියැදි සහතිකවල විෂමතා හේතුවෙන් ට්‍රැපිගුරා නැව්තොග වලට අදාල වියදම් අඩු | වත්කම් හා වගකීම්වල පැවැත්ම සහතික කිරීම උදෙසා විගණනයට සාක්ෂි පැවතිය යුතුය. |

කිරීමෙන් හා මිල අඩු කිරීම්වලින් පසු ට්‍රැපිගුරා වෙතින් ලබාගෙන ඇති ද්‍රවශීලතා හානියේ ඉතිරි මුදල මෙය වේ.

සිලොන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් වෙත පැරණි ගෙවිය යුතු වටිනාකම රු. **28,347,444**

මෙම ශේෂය සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් විසින් තහවුරු කරන ලද අතර, භාණ්ඩ රක්ෂණ ගෙවීම්වල ඉන්වොයිසි හා රිසිට්පත්, සමාගම දැනටමත් ඉදිරිපත් කර ඇති බැවින් සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් විසින් නිවැරදි කිරීමේ සටහන් තැබීම අවශ්‍ය වේ.

විවිධ ණය ගැතියෝ රු. **18,075,802**

එම මුදල රේගුවට වැඩිපුර ගෙවීමකින් සමන්විත බව මූලික පරීක්ෂණවලින් අනාවරණය විය. කෙසේ වුවද, නිවැරදි ලැබිය යුතු ශේෂය හඳුනාගැනීම සඳහා වැඩිදුර විශ්ලේෂණයක් කරනු ලැබේ.

මණ්ඩලයෙන් ලැබිය යුතු රු. **4,674,041**

ශේෂයේ ස්වභාවය විමර්ශනය කර ඒ අනුව නිවැරදි කරනු ලැබේ.

වෙළඳ ණය ගැති (මණ්ඩලය) බොයිලේරු ගල් අඟුරු (ස්ටීම් කොල්) වටිනාකම රු. **7,750,000**

මෙම ශේෂය (එම්/එස් මර්කාටර්) වෙත කරන ලද ගෙවීමකින් සමන්විත වේ. මෙම කාරණය ද, මණ්ඩලය සහ සීඑස්සී සම්බන්ධ අමාත්‍යාංශවල ලේකම්වරුන් දෙදෙනා විසින් පත්කරන ලද විශේෂ කමිටුවක් ( නෙම්මාවත්ත කමිටුව) විසින් විමර්ශන කටයුතු කරනු ලබන අතර ඔවුන්ගේ වාර්තාව අපේක්ෂාවෙන් සිටී.

| | | |
|---|---|---|
| | මණ්ඩලයෙන් වෙනත් ලැබීම් රු. **1,760,500**<br><br>ශේෂයේ ස්වභාවය විමර්ශනය කර ඒ අනුව නිවැරදි කරනු ලැබේ.<br><br>වෙළඳ ණය හිමියන් - නෝබල් රිසෝර්සස් රු.**85,887,776**<br><br>මෙම ශේෂය ප්‍රධාන වශයෙන්ම, ණයවර ලිපිවල වලංගු කාල සීමාව ඉකුත්වීම හේතුවෙන් නෝබල් රිසෝර්සස් ඉන්ටර්නැෂනල් ප්‍රයිවෙට් ලිමිටඩ් විසින් අඩුවෙන් ලබාගන්නා ලද ශේෂයකින් සමන්විත වේ.<br><br>නෝබල් රිසෝර්සස් වෙතින් ලැබිය යුතු වටිනාකම රු.**1,115,987**<br><br>මෙම ණය ගැති ශේෂය ඉහත සඳහන් වෙළඳ ණය හිමි නෝබල් රිසෝර්සස් රු. **85,887,776** ට එරෙහිව හිලව් කරනු ලැබේ. | |
| **x.** ප්‍රතිපූර්ණ වියදම් මත ගෙවිය යුතු රු.**8,280,994** ක් වන එකතු කළ අගය මත බද්ද, එකතු කළ අගය මත බදු පාලන ගිණුමේ ගිණුම්ගත කර නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, එකතු කළ අගය මත බදු වගකීම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | විගණන විමසුමට අනුවම, මේවා සමාගම සතුව ඇති බිල්පත් ප්‍රතිපූර්ණය කිරීම් වේ. අපගේ සේවාවන් වෙනුවෙන් කිසිදු ආන්තිකයක් එකතු කර නැත. අපගේ බදු උපදේශක විසින් උපදෙස් දුන් පරිදි, වියදම් ප්‍රතිපූර්ණයන් එකතු කළ අගය මත බද්දට යටත් නොවේ. | දේශීය ආදායම් බදු පනතේ අවශ්‍යතාවන්ට අනුකූල වන්න. |
| **xi.** සමාගම සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් හරහා සැපයුම්කරුවෙකුට රු. **4,000,000** ක මුදලක් ගෙවා තිබුණ ද මේ සම්බන්ධයෙන් සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ්ට ගෙවිය යුතු හෝ ප්‍රකාශිත සැපයුම්කරුට ගෙවිය යුතු ලෙස ලෙජර් ගිණුමේ වගකීමක් නොතිබුණි. කෙසේ වුවද, සමාගම මෙම මුදල සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ්ට ගෙවිය යුතු ශේෂයෙන් වැරදියට අඩු කර ඇත. එබැවින්, වගකීම් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ශේෂයේ ස්වභාවය විමර්ශනය කර ඒ අනුව අනාගතයේදී නිවැරදි කරනු ලැබේ. | නිවැරදි ගිණුම්කරණ ප්‍රතිකර්මය භාවිතා කළ යුතුය. |
| **xii.** නැව් තොග අංක **123** වෙනුවෙන් රේගු ප්‍රකාශනය අනුව, සත්‍ය එකතු කළ අගය මත බදු මුදල රු.**106,969,404** ක් වුව ද, සමාගම රේගු එකතු කළ අගය මත බදු ලෙස රු.**136,236,370** ක ප්‍රමාණයක් ගෙවා | ශේෂය **2020** මුල්‍ය වර්ෂය තුළදී නිවැරදි කරනු ලැබේ . | නිවැරදි ගිණුම්කරණ ප්‍රතිකර්මය භාවිතා කළ යුතුය. |

| | | |
|---|---|---|
| තිබුණි. එබැවින්, වැඩිපුර ගෙවන ලද එකතු කළ අගය මත බදු මුදල රු.**29,266,965** ක් වූ අතර මූල්‍ය ප්‍රකාශනයේ එය රු. **26,507,084** ක එකතු කළ අගය මත බදු ලැබිය යුතු ලෙස පෙන්වා තිබුණි. එහෙයින්, ශේෂ දෙක අතර රු.**2,759,882** ක වෙනසක් විගණනයේදී නිරීක්ෂණය විය. | | |
| **xiii.** සමාගම රු.**5,218,271** ක මුදලක් සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් ගෙවිය යුතු ගිණුමට හර කර තිබුණි. කෙසේ වෙතත්, මෙම මුදල සත්‍යාපනය කිරීමට අධාරක ලේඛන හා හේතු ලබා දී නොතිබුණි. තවද, සමාගම හා සිලෝන් ෂිපින් කෝපරේෂන් ලිමිටඩ් හි ශේෂ අතර රු.**31,916,562** ක වෙනස සමාගම විසින් සසඳා නොතිබුණි. | **2020** මූල්‍ය වර්ෂයේදී අවශ්‍ය නිවැරදි කිරීමේ සටහන් තබනු ලැබේ. | වෙනස්කම් සඳහා හේතු අඛණ්ඩව හඳුනා ගත යුතු අතර ඒ අනුව අවශ්‍ය ගැලපීම් කළ යුතුය. |
| **xiv.** බදු ගෙවීම පැහැර හැරීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් **2018** ජනවාරි **04** දිනැති ලිපිය මඟින් පනවා ඇති දඩ මුදල් වන ආර්ථික සේවා ගාස්තු **(ESC)** මත රු.**500,546** ක්, ජාතිය ගොඩනැගීමේ බද්ද මත **(NBT)** රු.**10,134,113** ක් සහ එකතු කළ අගය මත බද්ද **(VAT)** රු.**1,900,938** ක් ගෙවිය යුතු දඩ මුදල් ලෙස හෙළිදරව් නොකර ගෙවිය යුතු බදු යටතේ ගිණුම් ගත කර තිබුණි. | දඩ මුදල් ඉවත් කිරීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කරන ලද අතර එබැවින් **2020** වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල අවශ්‍ය හෙළිදරව් කිරීම් කරනු ලැබේ. | නිවැරදි ගිණුම්කරණ ප්‍රතිකර්මය භාවිතා කළ යුතු අතර දඩ මුදල් වළක්වා ගැනීමට පද්ධතිය සංවර්ධනය කළ යුතුය. |
| (ආ) මා විසින් පහත කරුණු ඇතුළත්ව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූල නොවීම ප්‍රධාන වශයෙන් පදනම් කර ගෙන ශ්‍රී ලංකා එනර්ජීස් ප්‍රයිවට් ලිමිටඩ් හි මූල්‍ය ප්‍රකාශන මත තත්ත්වාගණනය කළ විගණන මතය නිකුත් කරන ලදි. | | |
| **i** පහත ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය කරන ලදි.<br>**- SLFRS 7** වගන්ති **8, 31, 33**<br>**- SLFRS 15** වගන්ති **1**<br>**- LKAS 1** වගන්ති **79, 113, 117**<br>**- LKAS 2** වගන්ති **37**<br>**- LKAS 7** වගන්ති **20**<br>**- LKAS 8** වගන්ති **28, 30**<br>**- LKAS 12** වගන්ති **80, 81**<br>**- LKAS 16** වගන්ති **73 (c)**<br>**- LKAS 19** වගන්ති **57, 140, 141**<br>**- LKAS 24** වගන්ති **17**<br>**- LKAS 38** වගන්ති **118 (a, b)** | **2020** සිට ඉදිරියට ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුව මෙම යහපත් පරිචයන් පිළිපැදීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ප්‍රමිති අවශ්‍යතාවන්ට අනුකූල වන්න. |

| | | |
|---|---|---|
| (ii) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ (සංශෝධිත පරිදි) 2(2) වගන්තිය පරිදි, ආයතනයක පිරිවැටුම කාර්තුවකට (කාර්තුවක සීමාව) රු. මිලියන 12.5 ඉක්මවා ඇති විට ආර්ථික සේවා ගාස්තුවලට යටත් වේ. සමාගමේ පිරිවැටුම (මුළු පිරිවැටුම) රු. මිලියන 396 ක් විය. කෙසේ වුවද, සමාගම 2019 වර්ෂය සඳහා ආර්ථික සේවා ගාස්තු ගෙවා නොමැති අතර එබැවින් ආර්ථික සේවා ගාස්තු වගකීම රු.1,983,064 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ශ්‍රී ලංකා එනර්ජීස් ප්‍රයිවට් ලිමිටඩ් සමාගම අනාගතයේදී අවශ්‍ය පරිදි අනුකූල වේ. | සමාගම පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය. |
| (iii) සමාගමේ කාර්යය මණ්ඩලය කිසිදු කළමනාකරණ ගාස්තුවක් අය නොකර පරිපාලිතවල ද පරිපාලන කටයුතු කරනු ලබයි. එබැවින්, සමූහයේ කාර්යය මණ්ඩල වියදම් රු.24,847,325 ක මුදලක් වැරදි ලෙස සමාගමට අය කර ඇත. | වර්ෂය තුළදී, පරිපාලිත ප්‍රමාණවත් අතිරික්තයක් ජනනය කර නොමැති නිසා හා කළමනාකරණ ගාස්තු අය කිරීමේ මූලධර්මය බලාත්මක කර නොමැති බැවින් 2020 වර්ෂයේ සිට ඉදිරියට එයට අනුගත වේ. | පරිපාලිත වෙනුවෙන් සමාගම විසින් දරන ලද වියදම් ප්‍රතිපූර්ණය කර ගත යුතුය. |

### 1.5.2 ආයතනයේ අඛණ්ඩ පැවැත්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් (TPCL) හි විගණක එහි මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පහත කරුණ අවධාරණය කර ඇත.<br><br>සාම්පූර්හි මෙගාවොට් 500 ක ගල්අඟුරු බලාගාරයක් සංවර්ධනය කිරීමේ එකම අරමුණ ඇතිව ක්‍රියාත්මක වූ සමාගම, එම විදුලි බලාගාරය සංවර්ධනය කිරීමේ කටයුතු නවතා දමා ඇති අතර මීට පෙර ප්‍රාග්ධනිත කළ වියදම් 2018 වර්ෂයේදී ලියා හැර ඇත. ඒ වෙනුවට, සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය ඉදි කිරීම සඳහා ලබා දී තිබූ එම ඉඩමෙහිම මෙගාවොට් 50 ක සූර්ය බලාගාරයක් සමාගම විසින් ස්ථාපිත කිරීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ලැබී තිබුණි. තවද, කෙරවලපිටියෙහි මෙගාවොට් 500 ක එල්එන්ජී බලාගාරයක් සංවර්ධනය කිරීමට ද කැබිනට් අනුමැතිය ලබා දී තිබේ. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් ඉහත බලාගාර වල සංවර්ධන කටයුතු වල කිසිදු වැඩි දියුණු කිරීමක් සිදු කර නොතිබුණි. ඒ අනුව, මෙයින් ඇඟවෙන්නේ සමාගම අඛණ්ඩ පැවැත්මක් ලෙස පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳ සැලකිය යුතු සැකයක් ඇති කළ හැකි, ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පවතින බවයි. | මෙගා වොට් 50 ක සූර්ය බලශක්ති හා මෙගාවොට් 500 ක එල්එන්ජී බලාගාර සංවර්ධනය කිරීමට කැබිනට් අනුමැතිය ලබා දී ඇති නිසා සාම්පූර්හි ගල් අඟුරු බලාගාරය සඳහා වෙන් කර ඇති ඉඩම, මෙගාවොට් 50 ක සූර්ය බල ශක්ති ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් තීරණය කර ඇත. පසු ගිය කාලසීමාව තුළ ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ් හි පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ප්‍රකාශිත කාරණය අඛණ්ඩව සාකච්ඡා කරන ලද අතර මේ වන විට ට්‍රින්කොමලී පවර් කම්පැනි ලිමිටඩ්ට සූර්ය බලශක්ති ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට හැකි වනු පිණිස එහි සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. සූර්ය බල ශක්ති ව්‍යාපෘතිය ආරම්භ කිරීම සඳහා 2020 දී ඉන්දියාවේ නැෂනල් | බලශක්ති හිඟය සහ හදිසි විදුලිය මිලදී ගැනීම් අවම කිරීමට නව යෝජනා වහාම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |

තර්මල් පවර් කම්පැනි ලිමිටඩ් සහ මණ්ඩලය අතර හවුල් ව්‍යාපාර ගිවිසුමක් අත්සන් කිරීමට ට්‍රින්කොමලි පවර් කම්පැනි ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලය අවශ්‍ය පියවර ගනු ඇත. කෙසේ වෙතත්, හවුල් ව්‍යාපාර ගිවිසුම අත්සන් කිරීමට පෙර අවශ්‍ය නීතිමය නිෂ්කාශනයන් නීතිපතිගෙන් ලබා ගත යුතුය.

මණ්ඩලය හා නැෂනල් තර්මල් පවර් කම්පැනි ලිමිටඩ් අතර සාකච්ඡා මාලාවකින් පසුව, මේ වන විට කෙරවලපිටියේ එල්එන්ජී බලාගාරය සංවර්ධනය කිරීම සඳහා හවුල් ව්‍යාපාර ගිවිසුමට දෙපාර්ශවයම **2019** ඔක්තෝබර් **25** දින අත්සන් කර තිබේ.

**COVID 19** හි බලපෑම හේතුවෙන් අද වන විට සාකච්ඡා වල ප්‍රගතිය නතර වී ඇත. කෙසේ වුවද, ඉදිරි කාලසීමාව තුළ යෝජිත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පියවර ගන්නා බව නැෂනල් තර්මල් පවර් කම්පැනි ලිමිටඩ් හි අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වී ඇත.

### 1.5.3 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| විශේෂ ප්‍රමිතිය සමඟ අනුකූල නොවීම | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **(අ) LKAS 1 -** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම. | | |
| **(i)** රු. **30,609,836** ක විවිධ ණය ගැති ශේෂයක් තැපැල් කාර්යාල කොමිස් හා විකිණීමේ ස්ථාන **(POS)** කවුන්ටර් ගෙවීම් සම්බන්ධ ණයහිමියන්ට එරෙහිව මණ්ඩලය හිලව් කර තිබේ. එහි ප්‍රතිඵලක් ලෙස, විවිධ ණයගැතියන් හා ණයහිමි ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | **2020** දී දෝෂ සටහන් නිවැරදි කරනු ලැබේ. | ප්‍රමිති අවශ්‍යතාවයන් සමඟ අනුකූල වන්න. |
| **(ii)** හරිත බල ශක්තිය සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතියට ලබා දී ඇති රු.**1,262,503,405** ක මුදල, සුළං බලශක්ති ව්‍යාපෘතියේ ලබා දීමක් ලෙස සටහන් අංක **24.2.1** හි දක්වා තිබුණි. | **2020** දී දෝෂ සටහන් නිවැරදි කරනු ලැබේ. | භාවිතා කරන්නන් සඳහා නිවැරදි තොරතුරු සැපයීමට හෙළිදරව් කිරීම් කළ යුතුය. |

| | | |
|---|---|---|
| **(iii)** ලබා ගන්නා ලද රු. බිලියන **83** ක ණය වෙනුවෙන් ණය සැකසුම් ගාස්තු ලෙස ගෙවන ලද රු. මිලියන **25** ක් මූල්‍ය පිරිවැය ලෙස ඉදිරිපත් කිරීම වෙනුවට පරිපාලන වියදම් යටතේ වෙනත් වියදම් ලෙස ඉදිරිපත් කර තිබුණි. | වියදම් වර්ගීකරණය නිවැරදි කිරීමට කටයුතු කර ඇත. | වියදම් වල නිවැරදි වර්ගීකරණය භාවිතා කළ යුතුය. |
| (ආ) **LKAS 2 -** තොග හා **LKAS 16 -** දේපල පිරියත හා උපකරණ | | |
| ඉහත ප්‍රමිති වල ප්‍රතිපාදනයන් පරිදි, මණ්ඩලය එහි ප්‍රාග්ධන හා නඩත්තු කාර්යයන්වල ශ්‍රමය, ද්‍රව්‍ය හා පොදු කාර්ය පිරිවැයන් අගය කිරීම සඳහා සත්‍ය පිරිවැය භාවිතා කිරීම වෙනුවට, ප්‍රමිත පිරිවැය ක්‍රමය යොදා ගනියි. එහි ප්‍රතිඵලයක් ලෙස, ඇතිවුන එකතුව රු.**6,409,494,526** ක වාසියක ද්‍රව්‍ය මිල විචලනය, ශ්‍රම හා පොදු කාර්ය අනුපාත විචලනයන් සහ අවාසිදායක තොග මිල විචලනය රු. **2,428,128,229** ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙනැවිත් තිබුණි.<br><br>එහි ප්‍රතිඵලයක් ලෙස, ප්‍රාග්ධන කාර්යයන් සම්බන්ධ ඉහළ මූල්‍ය මැදිහත්වීම හේතුවෙන් මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵල, වත්කම්, වගකීම් හා හිමිකම් වලට සැලකිය යුතු ලෙස බලපා ඇත. කෙසේ වෙතත්, එම ප්‍රාග්ධන කාර්යයන් සම්බන්ධව අවශ්‍ය තොරතුරු නොමැති වීම හේතුවෙන් එමගින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම විගණනයේදී නිශ්චය කර ගත නොහැකි විය. | **LKAS 2** හි **21** වන ඡේදයට අනුව, තොග මැනීම සඳහා ප්‍රමිත පිරිවැය ක්‍රමය නිර්දේශ කර ඇත. ඒ අනුව, සත්‍ය පිරිවැය භාවිතා කිරීමේ ප්‍රායෝගික අපහසුතාවය හේතුවෙන් තොග, කෙරීගෙන යන වැඩ සහ දේපල, පිරියත හා උපකරණ අගය කිරීම සඳහා මණ්ඩලය ප්‍රමිත මිල ගණන් භාවිතා කරයි. තොගයේ ප්‍රමිත මිල ගණන් තීරණය කිරීමට පිහිටුවන ලද කමිටුව, තොගයේ සත්‍ය මිලයන්ට ඉතා ආසන්න නිවැරදි හා සාධාරණ ඇස්තමේන්තුවක් නිශ්චය කිරීමට කටයුතු කරයි. කෙසේ වෙතත්, තාක්ෂණික හා ඒවායේ සංකීර්ණත්වය හා තොගයේ විශාල පරිමාව හේතුවෙන්, සත්‍ය හා ප්‍රමිත මිල ගණන් අතර පරතරයක් ඇත. ඒකාබද්ධ ගිණුම්කරණ පද්ධතිය හඳුන්වා දුන් පසු මෙම කාරණය විසඳෙනු ඇත. ප්‍රමිත මිල ගණන් හා සත්‍ය මිල ගණන් අතර පරතරය අවම කිරීමට මණ්ඩලය පහත ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.<br><br>• **DD 4** හා **DD 3** හි ශ්‍රම අනුපාත විචලනය **2019** වර්ෂයේ මූල්‍ය ගිණුම් වලින් ඉවත් කර ඇත. අනෙක් අංශ දෙකකට **2020** වර්ෂයේදී එය කිරීමට හැකි වේ.<br><br>• පත්කරන ලද කමිටුවේ නිර්දේශ පරිදි තොග ගණනය සඳහා බර තැබූ සාමාන්‍ය ක්‍රමය යොදා ගැනීමත් සමඟ මූල්‍ය ප්‍රකාශන වලට ද්‍රව්‍ය මිල විචලනයේ බලපෑම | තොගය අගය කරන විට සත්‍ය පිරිවැය හෝ දළ ආසන්න පිරිවැය පදනම භාවිතා කළ යුතුය. |

ඉවත් කිරීමට හැකි වේ. මෙය කෙරීගෙන යන ව්‍යවසාය සම්පත් සැළසුම්කරණ (ERP) පද්ධතිය මඟින් ආමන්ත්‍රණය කරන බැවින් මෙම ගැටළුව ව්‍යවසාය සම්පත් සැළසුම්කරණ පද්ධතිය ක්‍රියාත්මක වූ පසු විසඳෙනු ඇත.

- කෙරීගෙන යන වැඩවලින් මාරු කරනු ලබන බෙදාහැරීමේ වත්කම් හැර, සියලු අනිකුත් දේපල, පිරියත හා උපකරණ (ඉඩම්, ගොඩනැගිලි, මෝටර් වාහන, යන්ත්‍ර සූත්‍ර, හා කාර්යාල උපකරණ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවල නිර්දේශ වලට අනුකූල වන සත්‍ය පිරිවැයට අගය කරනු ලැබේ.

(ඇ)**LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තු වල වෙනස් වීම් හා වැරදි**

මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති ජංගම නොවන වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සඳහන් කර ඇති පරිදි සමාලෝචනය කර නොමැත. උදාහරණයක් ලෙස, පිළිවෙලින් රු.**32,241,176,427** ක් හා රු.**3,918,235,311** ක් පිරිවැය වන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද විදුලි බලාගාර **4** ක් හා මෝටර් වාහන **1,683** ක් සත්‍ය ජීවකාලය ඇස්තමේන්තු කිරීමකින් තොරව තවමත් භාවිතා කරමින් සිටියි.

**(i)** <u>සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද , රු. **3,918,235,311** ක් පිරිවැය වන මෝටර් වාහන **1,683** සංඛ්‍යාව</u>

මෝටර් වාහන වල ප්‍රයෝජනවත් ජීව කාලය සම්බන්ධයෙන් අංශ වලින් දත්ත එකතු කරන ලද අතර විශ්ලේෂණය කරමින් පවතියි. **2020** වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන වල සංශෝධිත ප්‍රයෝජනවත් ජීව කාලය වාර්තා කිරීමට නිර්දේශ කළ හැකිය.

**(ii.)**<u>රු.**32,241,176,427** ක සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද විදුලි බලාගාර **4**</u>

උත්පාදන අංශයේ බලාගාර ස්වභාවයෙන්ම අනන්‍ය හා සංකීර්ණ වේ. මුල් නිෂ්පාදකයාගේ නිර්දේශය මත පදනම්ව විදුලි ජනක යන්ත්‍ර වල ආර්ථික ජීව කාලය තීරණය කෙරේ. විදුලි බලාගාරවල ආර්ථික ජීව කාලය නැවත සලකා බැලීමට කමිටුවක් පත් කරනු ලැබේ. මණ්ඩලය විදුලි බලාගාර හොඳින් නඩත්තු කරන බැවින් විදුලි ජනක යන්ත්‍ර මුල් උපකරණ නිෂ්පාදකයාගේ අපේක්ෂිත ආයු කාලයටත් වඩා ක්‍රියාත්මක වේ.

මණ්ඩලය විසින් අඛණ්ඩව භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන්ම ක්ෂය කර ඇති ජංගම නොවන වත්කම් වල ප්‍රයෝජනවත් ජීව කාලය ගිණුම්කරණ ප්‍රතිපත්ති වල සඳහන් කර ඇති පරිදි සමාලෝචන කළ යුතුය.

(ඈ) **LKAS 16 - දේපල, පිරියත හා උපකරණ**

| | | |
|---|---|---|
| සම්ප්‍රේෂණ අංශයේ රු. 172,019,335 ,924 ක වටිනාකම ඇති ස්ථාවර වත්කම් සමාලෝචිත වර්ෂය තුළදී භෞතිකව සත්‍යාපනය කර නොතිබුණි. | සම්ප්‍රේෂණ අංශයේ ස්ථාවර වත්කම් වල භෞතික පැවැත්ම සම්බන්ධයෙන් වාර්ෂික භෞතික සත්‍යාපනයක් සිදු කිරීමට අදාල උපදෙස් නිකුත් කර ඇත. | LKAS 16 අනුව සෑම වසරකම ස්ථාවර වතකම් භෞතිකව සත්‍යාපනය කළ යුතුය. |

## 1.5.4 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) රු.3,535,799,151 ක හර ශේෂයක් (තොග හිඟය) සහ රු.90,343,073 ක බැර ශේෂයක් (තොග අතිරික්තය) නිරවුල් නොකර වසරකට වඩා වැඩි කාලයක් තිස්සේ තොග ගැලපුම් ගිණුමේ රඳවා තිබුණි. | 2020 දී හැකි පරිදි අවශ්‍ය පොත් සටහන් තැබීමට අදාල අංශ විසින් ක්‍රියාමාර්ග ගෙන ඇති අතර ඉතිරි හිඟ ශේෂ නීති ක්‍රියාමාර්ග අවසන් වීමෙන් පසු නිරවුල් කරනු ලැබේ. | තොගයේ අතිරික්ත හා හිඟයන් සිදුවීමෙන් කෙටි කාලයක් තුළ නිරවුල් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) අමාත්‍ය මණ්ඩලයේ තීරණ අංක 10/2434/423/034 ට අනුව, ලක්විජය විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා ලබා ගන්නා ලද රු.159,184,187,965 ක ණය මුදල වෙනුවෙන් වන ණය හා පොලිය මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතුය. කෙසේ වෙතත්, මහා භාණ්ඩාගාරයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුව 2018 දෙසැම්බර් 31 දක්වා රු.25,247,801,891 ක මුදලක් එම ණයෙහි පොලිය ලෙස ණය ලබා දුන් බැංකුවට ගෙවා තිබුණද, මණ්ඩලය ඉහත ගෙවීම් කර හෝ ඒ වෙනුවෙන් එහි ගිණුම්වල ප්‍රතිපාදනය කර හෝ නොතිබුණි. පොලිය ප්‍රතිපාදනය නොකිරීමේ ප්‍රතිඵලයක් ලෙස, 2019 දෙසැම්බර් 31 දිනට රඳවා ගත් ඉපයීම් රු.25,247,801,891 කින් වැඩියෙන් දැක්වුණි. | මණ්ඩලයේ ද්‍රවශීලතා තත්වයේ ප්‍රමාණාත්මකභාවය සැලකිල්ලට ගනිමින් 2018 වර්ෂය දක්වා ආපසු ගෙවීම මහා භාණ්ඩාගාරය විසින් අන්තර්ග්‍රහනය කර ඇත. කෙසේ වුවද, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තවේ අධ්‍යක්ෂ ජෙනරාල්ගේ නියෝගය අනුව, 2019 කාලය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද රු.3,556,442,931.30 ක පොලී ගෙවීමේ වටිනාකම මණ්ඩලයේ පොත් වලට ගලපා ඇත. තවද, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ නියෝගයට යටත්ව 2020 වර්ෂයේ සිට ඉදිරියට ගැලපීම් සිදු කළ යුතු බව සටහන් කර ගන්නා ලදි. | භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් ලිඛිත නියෝගය ලැබුණු විට මණ්ඩලයේ පොත්වල ගැලපීමට හෝ හිඟ ශේෂ ගෙවීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඇ) ලිපි අංක PED/1/ CEB /2/11(i) දරන භාණ්ඩාගාරයේ ඉල්ලීම පරිදි, 2019 ඔක්තෝබර් 17 දින හිමිකමට වාර්තා කළ රු.3,556,442,931 ක මුදලක්, සමාලෝචිත වර්ෂය තුළදී පොලී වියදම් | LKAS 23 (ණය ගැණුම් පිරිවැය) ට අනුව, වත්කම් වාණිජකරණය කිරීමෙන් පසු දරන ලද රු.3,556,442,931.30 ක ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කළ නොහැකිය. ඒ | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී මෙහෙයුම් සඳහා දරනු නොලැබූ වියදම් සැලකිල්ලට නොගත |

| | | |
|---|---|---|
| ලෙස ආදායම් ප්‍රකාශනයට අය කරන ලදි. තවද, මෙම මුදල මණ්ඩලය විසින් දරා නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලයේ අලාභය එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි. | අනුව, **2019** කාලය සඳහා භාණ්ඩාගාරය විසින් ගෙවන ලද පොලිය ආදායම් ප්‍රකාශනයට අය කර ඇත. එබැවින්, ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව, මණ්ඩලයේ අලාභයේ වැඩිවීමක් නොමැත. | යුතුය. |
| (ඇ) මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලබන සේවක අර්ථසාධක අරමුදල වෙනුවෙන් මණ්ඩලය විසින් දරනු ලැබූ රු.**41,816,475** ක වියදම් ප්‍රතිපූර්ණය කිරීමකින් තොරව මණ්ඩලයෙහි වියදම් ලෙස සලකනු ලැබූ අතර එබැවින් සමාලෝචිත වර්ෂයේ අලාභය සමාන ප්‍රමාණයකින් වැඩියෙන් දක්වා තිබුණි. | **2003** දෙසැම්බර් **31** දිනැති සාමාන්‍ය ගැසට් නිවේදන අංක **1321/18** යටතේ ප්‍රකාශට පත් කරන ලද, අර්ථසාධක අරමුදල් රීති **20(i)** වගන්තිය අනුව, ආයෝජන මිලට ගැනීමට හා විකිණීමට සෘජුවම අදාල කළ හැකි වියදම් ඇතුළුව අර්ථසාධක අරමුදල කළමනාකරණය හා පරිපාලනය කිරීමේ වියදම් කලින් කලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් හැර මණ්ඩලයේ අරමුදල් මත අය කිරීමක් විය යුතුය.<br><br>එබැවින්, මණ්ඩලයෙහි අර්ථසාධක අරමුදලට අදාල වියදම් රු.**41,421,524** ක මුදලක් මණ්ඩලයෙහි මූල්‍ය ප්‍රකාශන වලට ඇතුළත් කිරීම ඉහත දැක්වූ මණ්ඩලයේ අර්ථ සාධක අරමුදල් රීති වලට අනුකූල වේ. එබැවින්, අර්ථසාධක අරමුදල් වියදම් මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු ලෙස වාර්තා කිරීමට මණ්ඩලයට අවශ්‍ය නොවේ. | මණ්ඩලය සේවක අර්ථසාධක අරමුදල් රීති සංශෝධනය කළ යුතු අතර අරමුදල පරිපාලනයට මණ්ඩලය විසින් දරන ලද වියදම් අය කර ගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) **2013** ට පෙර රාජ්‍ය ආයතනවල විදුලි ජනක යන්ත්‍ර, සෝපාන හා වායු සමීකරණ යන්ත්‍ර සැපයීම, නඩත්තු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා මණ්ඩලය විසින් කරනු ලබන කාර්යයන් ඒවායේ ඉන්වොයිස් අගයන් වල පදනම මත ගිණුම්කරණය කරනු වෙනුවට, පිරිවැය මත අගය කර ඒ අනුව ඒවා ගිණුම්කරණය කරන ලදි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති ලැබිය යුතු දෑ හා රඳවාගත් ඉපයීම් රු.**66,987,761** කින් අඩුවෙන් දැක්වුණි. | **2013** ට පෙර, ණය ගැතියන් මුදල් පදනම මත ගිණුම්කරණය කරන ලද අතර කාර්යයේ සත්‍ය පිරිවැය පාරිභෝගිකයාගෙන් ලැබිය යුතු දෑ ලෙස පෙන්වන ලදි. මූල්‍ය ප්‍රකාශන වල පෙන්වා ඇති **2013** ට පෙර බොහෝ ලැබිය යුතු දෑ ආපසු අයකර ගත නොහැකිය. එම ලැබිය යුතු දෑ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් ලැබිය යුතුව දෑ, රෝහල් වලින් ලැබිය යුතු දෑ හා මණ්ඩලයේ සභාපතිවරයාගෙන් ලැබුණු උපදෙස් මත පදනම්ව මණ්ඩලය විසින් කරන ලද කාර්යයන් යනාදියෙන් සමන්විත වේ. | වංචා අවදානම අවම කිරීමට ඉන්වොයිසි වල වාර්තා නොකළ වටිනාකම ගිණුම්කරණය කළ යුතුය. |

| | | |
|---|---|---|
| | අයකරගත නොහැකි ශේෂ ඇස්තමේන්තු කරන ලද අගයන් මත ඉන්වොයිසි කිරීම හා මණ්ඩලය අනවශ්‍ය අලාභයකට හේතුවන එකතු කළ අගය මත බදු ගෙවීම විචක්ෂණශීලී නොවේ. එබැවින්, සත්‍ය පිරිවැය අයකර ගත යුතු මුදල ලෙස දැක්වේ.<br><br>මෙම ගැටලුව අවස්ථා කිහිපයකදී විගණනයට දැනුම් දුන් නමුත් එකම ගැටළුව නැවත දැක්වේ. තවද, එම අයකර ගත නොහැකි ලැබිය යුතු දෑ වෙනුවෙන් මණ්ඩලය සම්පූර්ණ ප්‍රතිපාදනය කර ඇත. වර්තමාන වෙනස **(2020 ජූනි 30** වන විට) සත්‍ය පිරිවැය සමඟ **2013** ට පෙර ඇස්තමේන්තු ගත වටිනාකම රු. **53,052,302** කි.<br><br>(සටහන - විගණකාධිපති වාර්තාවේ දක්වා ඇති වටිනාකම රු.**66,978,761** වෙනුවට රු.**53,052,302.10** ලෙස නිවැරදි විය යුතුය.) | |
| (ඊ) **2016** වර්ෂයේ බදු **(Levy)** ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු. බිලියන **5** න් රු.මිලියන **500** ක් සමාලෝචිත වර්ෂය තුළ දී කළමණාකරණ ගාස්තු ගෙවීම ලෙස වර්ග කර ආදායම් ප්‍රකාශනයට ක්‍රමක්ෂය කර තිබුණු අතර රු.බිලියන **1** ක් සඳහා අතීතානුයෝගී ගැලපීමක් කර තිබුණි. ඉතිරි මුදල වන රු.බිලියන **3.5** හිමිකම් ප්‍රකාශනයට අයකිරීම වෙනුවට මූල්‍ය ප්‍රකාශනයේ වෙනත් ණය ගැතියන් ලෙස දැක්වේ. කෙසේ වෙතත්, මණ්ඩලය විසින් මහා භාණ්ඩාගාරයෙන් කළමනාකරණ සේවා ලබා ගෙන නොතිබුණි. එබැවින් වර්ෂයේ අලාභය රු.මිලියන **500** කින් වැඩියෙන් දැක්වුණි. | **2019** ඔක්තෝබර් **16** දිනැති අංක **PED/I/CEB/2/11/(iii)** දරන රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ලිපිය ප්‍රකාරව, මෙම ගෙවීම **2019** වර්ෂය සඳහා භාණ්ඩාගාරයට ගෙවූ "කළමනාකරණ ගාස්තුව" ලෙස සලකන ලද අතර, **2017** වර්ෂයේ සිට ආරම්භ කර වසර **10** ක කාලයක් පුරා ක්‍රමක්ෂය කර ඇත.<br>භාණ්ඩාගාරය මඟින් මණ්ඩලයේ එදිනෙදා ක්‍රියාකාරීත්වයට මූල්‍ය කටයුතු සැපයීම හා පහසුකම් සැලසීම කරයි. | **2016** වර්ෂයේ බදු **(Levy)** ලෙස මහා භාණ්ඩාගාරයට ගෙවන ලද රු.බිලියන **5** ක මුදල ගණුදෙනුව සිදුවන අවස්ථාවේ හිමිකම් ප්‍රකාශනයට අයකළ යුතුය. |
| (උ) උපණය ගිවිසුම් වල කොන්දේසි වලට අනුව, මහා භාණ්ඩාගාරට ගෙවිය යුතු රු.**2,495,574,443** ක පොලිය මණ්ඩලය විසින් ගෙවා හෝ ඒ සඳහා ප්‍රතිපාදනය කර නොතිබුණි. | උපණය ගිවිසුම් මත පොලිය වෙනුවෙන් යම් ප්‍රතිපාදනයක් කිරීමට රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව මණ්ඩලයට උපදෙස් දී හෝ නියෝග කර නොමැත. මේ සඳහා මණ්ඩලය කිසිදු වෙන් කිරීමක් සිදු කර නොතිබුණි. | උපණය ගිවිසුම් වල කොන්දේසි ප්‍රකාරව මණ්ඩලය මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු පොලිය ගෙවීම හෝ ඒ වෙනුවෙන් ප්‍රතිපාදන කළ යුතුය. |

| | | |
|---|---|---|
| (ඌ) භාණ්ඩාගාරයෙන් සියයට **10** ක ලාභාංශ බද්ද ලෙස නම් කරන ලද රු.**4,200,000** ක මුදලක්, ප්‍රධාන කාර්යාලයේ පොත්වල හඳුනා නොගත් වෙනත් ණය ගැතියන් ලෙස පැවතුණි. මෙම මුදල වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදනය කර නොතිබුණි. | මෙය **2005/2006** වර්ෂය සඳහා රු.**42,000,000** ක දළ ලාභාංශ ගෙවීමේදී ලංකා ට්‍රාන්ස්ෆෝමර්ස් ලිමිටඩ් විසින් අඩු කරන ලද සියයට **10** ක ලාභාංශ බද්ද නියෝජනය කරයි. මෙය **2020** වර්ෂයේදී නිවැරදි කර ඇත. | අවශ්‍ය ගිණුම්කරණ ප්‍රතිකර්මය භාවිතා කළ යුතුය. |
| (එ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ප්‍රමාද පොලිය රු.**31,119,302** ක මුදලක් ගිණුම් පොත් වලින් මඟ හැරී ඇත. එබැවින්, සමාලෝචිත වර්ෂයේ අලාභය අඩුවෙන් දැක්වුණි. | **2020** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනයේ ප්‍රමාද පොලිය වාර්තා කිරීමට පියවර ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම්කරණ කාල පරිච්ඡේදයට අදාල වියදම් සැලකිල්ලට ගත යුතුය. |
| (ඒ) රු. **734,574,801** ක් වටිනා සම්පූර්ණ කරන ලද කාර්යයන් බෙදා හැරීම් අංශ **1** හි වත්කම් වලට මාරු නොකර කෙරීගෙන යන වැඩ ගිණුමේ පවතී. එම වත්කම් වලට අදාල ක්ෂය, ආදායම් ප්රකාශනයට අය කර නොතිබුණි. | පළාත — වටිනාකම රු.<br>උතුරු මැද පළාත — **80,000,759**<br>කොළඹ නගරය — **441,076,386**<br>උතුරු පළාත — **213,497,656**<br>එකතුව — **734,574,801**<br><br>ඉහත විගණන විමසුමෙන් උතුරු මැද පළාත සඳහා රු.මිලියන **80** ක් (පිරිවැය මධ්‍යස්ථාන **420.20** හා **420.30** යටතේ) පෙන්නුම් කළද, **2019** දෙසැම්බර් **31** දිනට ගිණුම් පොත්පත් අනුව එම පිරිවැය මධ්‍යස්ථාන වල කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ ශේෂය රු.මිලියන **794** ක් විය. එම ශේෂයෙන් රු.මිලියන **309** ක් පිරිවැය මධ්‍යස්ථාන **420.20** යටතේ ද රු. මිලියන **4** ක් පිරිවැය මධ්‍යස්ථාන **420.30** යටතේද **2020** වර්ෂයේදී වත්කම් වලට මාරු කර ඇත. ඒ අනුව, එකතුව ගත් විට රු. මිලියන **313** ක් **2020** වර්ෂයේදී උතුරු මැද පළාත යටතේ කෙරීගෙන යන වැඩ වලින් වත්කම් වලට මාරු කර ඇත.<br><br>කොළඹ නගර පළාත යටතේ, ඉහත ශේෂයෙන්, මුළු වටිනාකම රු.**59,668,220.81** ක් **2020** වර්ෂයේ දී වත්කම් වලට මැරු කර ඇත. | අවසන් වූ කාර්යයන් නිම කළ අවස්ථාවේදී වත්කම් ගිණුම් වලට මාරු කළ යුතුය. |

| | | |
|---|---|---|
| | මීට අමතරව, නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (එන්පී) ගේ උපදෙස් ප්‍රකාරව, උතුරු පළාතේ අදාල නිලධාරීන් විසින් ඔවුන්ගේ අවසන් වාර්තා වලට අනුව මාරු කළ හැකි කෙරීගෙන යන වැඩ ශේෂ ගණනය කරමින් සිටින අතර **2020** වර්ෂය තුළදී එය ගලපනු ලැබේ.<br><br>සාමාන්‍යයෙන්, කෙරීගෙන යන වැඩ පිළිබඳ සියලු පළාත් විසින් කාලානුරූපී සමාලෝචනය හා අධීක්ෂණය කරනු ලබන අතර අවසන් වූ කාර්යයන් නිම කල අවස්ථාවේදී මාරු කරනු ලැබේ. | |
| (ඔ) මොරගහකන්ද විදුලි බලාගාරයෙන් විදුලිය මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.**128,264,040** ක මුදල සමාලෝචිත වර්ෂයේ ගිණුම් පොත්වලින් මඟහැරී තිබුණි. එබැවින්, වර්ෂයේ අලාභය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | **2020** ජූලි **31** න් අවසන් වන කාල පරිච්ඡේදය සඳහා ගිණුම් පොත් වල මොරගහකන්ද විදුලි බලාගාරයට අදාළ සියලු හිඟ ඉන්වොයිසි උපචිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. සියලු ඉන්වොයිසි කඩිනමින් වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ගණුදෙනු වාර්තා කිරීම සඳහා සීමාව (**cut off**) හඳුනාගැනීමට අභ්‍යන්තර පාලනය සංවර්ධනය කළ යුතුය. |
| (ඕ) **2012** දී නිම කරන ලද ඉහළ කොත්මලේ ජල විදුලි බලාගාර ව්‍යාපෘතියට අදාල කෙරීගෙන යන වැඩ රු**944,030,864** ක් ස්ථාවර වත්කම් වලට මාරු කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වීම හා රඳවා ගත් ඉපයීම් පිළිවෙලින් රු.**26,972,310** කින් හා රු.**161,833,862** කින් අඩුවෙන් දැක්වුණි. | මෙම ව්‍යාපෘතිය **2012** වර්ෂයේදී ආරම්භ කරන ලද අතර අදාල අංශ වලට මූලික වත්කම් පැවරීම **2014** වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. කෙසේ වෙතත්, මූලික වත්කම් පැවරීමෙන් පසු **2019** දෙසැම්බර් **31** දිනට රු.**944,030,864** ක් වටිනා වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිත වී ඇත. මෙම මුදල ප්‍රධාන වශයෙන්ම පුද්ගල වියදම්, බේරුම්කරණය සඳහා නීති වියදම් හා ඉඩම් අත්පත් කර ගැනීමේ පිරිවැයෙන් සමන්විත වේ. වර්තමාන වර්ෂය තුළදී ඉතිරි පිරිවැය අදාල අංශ වලට පැවරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | කෙරීගෙන යන වැඩ නිම වූ දිනයේදී වත්කම් වලට මාරු කළ යුතුය. |
| (ක) **2014** දී නිම කරන ලද පුත්තලම ගල් අඟුරු බලාගාරය ව්‍යාපෘතියට අදාල කෙරීගෙන යන වැඩ රු.**603,573,159** ක් ස්ථාවර වත්කම් වලට මාරු කර නොතිබුණි. එබැවින්, සමාලෝචිත වර්ෂය සඳහා ක්ෂය වීම හා රඳවා ගත් ඉපයීම් | මෙම ව්‍යාපෘතිය **2014** වර්ෂයේදී ආරම්භ කරන ලද අතර අදාල අංශ වලට මූලික වත්කම් පැවරීම **2015** වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදි. මූලික වත්කම් පැවරීමෙන් පසු **2019.12.31** දිනට රු.**603,573,159** ක් වටිනා | කෙරීගෙන යන වැඩ නිම වූ දිනයේදී වත්කම් වලට මාරු කළ යුතුය. |

| | | |
|---|---|---|
| පිළිවෙලින් රු.**20,119,105** කින් හා රු.**100,595,526** කින් අඩුවෙන් දැක්වුණි. | වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමේ සමුච්චිත වී ඇත. වර්තමාන වර්ෂය තුළදී ඉතිරි පිරිවැය අදාල අංශ වලට පැවරීමට ක්‍රියාමාර්ග ගනු ලැබේ. | |
| (ග) **2019** දෙසැම්බර් **31** දිනට රු. **367,390,040** ක බැර ශේෂයක් අන්තර් අංශ ශේෂ සමඟ හිලව් නොකර අන්තර් අංශ ජංගම ගිණුම ලෙස පැවතුණි. | මුළු ශේෂයෙන් රු.මිලියන **325** ක් **2020** මූල්‍ය වර්ෂය තුළදී නිවැරදි කර ඇත. | අන්තර් සමාගම් ශේෂ හිලව් කළ යුතු අතර අඛණ්ඩව සැසඳිය යුතුය. |
| (ඩ) සමාලෝචිත වර්ෂය තුළ ලබා දෙන ලද රු.මිලියන **999.03** ක් වාර්තා කර නොතිබුණි. එබැවින්, වගකීම් හා කෙරීගෙන යන වැඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් දැක්වුණි. | ඉහත සඳහන් කළ වෙනස ණය අංක **3146** හා ණය අංක **3147** ට සම්බන්ධ වේ. හරිත බලශක්තිය සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ණය කොටස **-1**) හි කොටස් කිහිපයක් විසින් ණය අංක **3146** උපයෝජනය කරන ලදි. ඉහත වාර්තා නොවූ ලබා දීම් වල ප්‍රධාන කොටස මොරගොල්ල ජල විදුලි බල ව්‍යාපෘතියට සම්බන්ධ වේ. මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනය මෙම ලබා දීම සමඟ යාවත්කාලීන නොවූ අතර එබැවින් මූල්‍ය ප්‍රකාශන ඉහත මුදල සමඟ යාවත්කාලීන කිරීමට නොහැකි විය. එහෙයින්, එය **2020** වර්ෂය සඳහා ලෙජරයේ යාවත්කාලීන වේ. | සත්‍ය කෙරීගෙන යන වැඩ හඳුනා ගැනීම සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන විට සියලු ලබා දීම් සැලකිල්ලට ගත යුතුය. |

**1.5.5** නොසැසඳූ පාලන ගිණුම් හා වාර්තා

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2019** දෙසැම්බර් **31** දිනට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන වල ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ලෙස දක්වන ශේෂය හා එම දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන වල ලැබිය යුතු ලෙස දක්වා ඇති අනුරූප ශේෂය අතර රු.**764,717,080** ක වෙනසක් නිරීක්ෂණය විය.<br><br>කෙසේ වෙතත්, **2013** සිට අඛණ්ඩව විගණන වාර්තා වල මෙම ගැටළුව අවධාරණය කර තිබුණද, **2019** දෙසැම්බර් **31** දින දක්වාත් මෙය නිරවුල් කර නොතිබුණි. | **2020** මූල්‍ය ප්‍රකාශන වල වාර්තා ගත නොවූ ප්‍රමාද පොලී ගාස්තු සැසඳීමට හා වාර්තා කිරීමට ක්‍රියාමාර්ග ගෙන තිබේ. | ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ සාකච්ඡා කිරීම හරහා ගැටළුව විසඳීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | |
|---|---|---|
| (ආ) බිල් කිරීමේ පද්ධතියේ මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල ඇතැම් ශේෂ මගහැරීම හේතුවෙන් බෙදාහැරීම් අංශ **1, 2, 3** හා **4** හි බිල් කිරීමේ පද්ධතියේ පෙන්වන **2019** දෙසැම්බර් **31** දිනට තොග **(bulk)** වෙළඳ ණයගැති ශේෂයන් හා සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අනුරූප වටිනාකම අතර එකතුව රු.**31,813,455** ක නොසැසඳූ වෙනස්කම් නිරීක්ෂණය විය. තවද, රු.**423,764,624** ක වටිනාකමක් **2012** සිට හඳුනා නොගත් ශේෂ ලෙස පවතී. | මණ්ඩලයේ බිල්කිරීමේ පද්ධතියේ බිල් ගනුදෙනු වාර්තා කිරීමේ ක්‍රියාවලිය හා පොදු ලෙජරයේ මූල්‍ය ගණුදෙනු වාර්තාව කිසිදු දිනකදී එකඟ නොවේ. එවැනි වෙනස්කම්වලට හේතු තීරණය කිරීම සඳහා බෙදාහැරීම් අංශ සැසඳීමක් සිදු කරයි.<br><br>තොග සැපයුම් ණය ගැති ලෙජර් ශේෂය තුළ ක්‍රියාකාරී ණය ගැතියන් හා අවසන් වූ ණය ගැතියන් ඇතුළත් වේ. කෙසේ වෙතත්, තොරතුරු තාක්ෂණ ශාඛාවේ බිල් කිරීමේ වාර්තා උද්ධෘතයෙහි ක්‍රියාකාරි ණය ගැති ශේෂය පමණක් ඇතුළත් වේ. එබැවින්, තොරතුරු තාක්ෂණ ශාඛාවේ බිල් කිරීම් වාර්තා උද්ධෘතයේ හා ලෙජර් ශේෂය අතර වෙනස ප්‍රධාන වශයෙන්ම සිදුවන්නේ අවසන් වූ ණය ගැතියන් හේතුවෙනි. | සෑම මසකම එක් එක් ලෙජර් ශේෂ හා බිල්පත් පද්ධති ශේෂ සැසඳීමට පියවර ගත යුතුය. |
| (ඇ) **2019** දෙසැම්බර් **31** දිනට එකතු කිරීම් පාලන ලෙජර් ගිණුමේ හර හා බැර වශයෙන් පවතින රු. **4,073,824,173** ක හා රු. **129,863,150** ක ශේෂ සඳහා **2005** ජූලි **26** දින නිකුත් කරන ලද **AFM (DD1)** දරන උපදෙස් ලිපිය ප්‍රකාරව, සැසඳීමක් කර නොතිබුණු අතර එම ශේෂ සඳහා හේතු විගණනයට සපයා නොතිබුණි. එබැවින්, එකතු කිරීම් පාලන ලෙජර් ගිණුමේ පවතින ශේෂයේ නිවැරදිතාවය සත්‍යාපනය කිරීමට නොහැකි විය. | සාමාන්‍ය සැපයුම් බිල් කිරීමේ චක්‍රය සීමාවන දිනය **(Cut off date)** මූල්‍ය ගිණුම් සීමාවන දිනයෙන් වෙනස්වීමෙන් මෙම වෙනස්කම් ඇති වේ. එබැවින්, සාමාන්‍ය සැපයුම් බිල් කිරීමේ චක්‍රය සීමාවන දිනයත් මූල්‍ය ගිණුම් සීමාවන දිනයත් එකම වීමට ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත. | බිල් කිරීමේ චක්‍රයට හා ගිණුම් කාලසීමාවට එකම කාලසීමාවක් දිනයක් යොදාගැනීමට ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ)අවිනිශ්චිත ශේෂයට අදාල රු.**79,512,030** ක මුළු ශේෂයෙන් සියයට **66** ක් සඳහා හා වසරකට වඩා වැඩි කාලයක් පුරා නිරවුල් නොකර පවතින රු.**70,306,494** ක් සඳහා වයස් විශ්ලේෂණය ඉදිරිපත් කර නොතිබුණි. | හඳුනා නොගත් පාරිභෝගික ගෙවීම් හඳුනාගෙන පාරිභෝගික ගිණුම් වලට බැර කිරීමට අඛණ්ඩ උත්සාහය යොදවා ඇත. ඉහත දක්වා ඇති ශේෂයන්ගෙන් බොහොමයක් පාරිභෝගිකයන්ගෙන් පැමිණිලි ලැබෙන තුරු මණ්ඩලයේ හඳුනාගැනීමෙන් තොරව පවතී. මෙම ශේෂය දැඩි අධීක්ෂණය හෝ පෙර දැකීම යටතේ පවතී. | සැලකිය යුතු කාලසීමාව ඉක්මවා ගොස් ඇති එකතු කිරීම්, සංවිධානයේ ආදායම ලෙස හඳුනාගත යුතුය. |

**1.6 අවසර නොලත් ගනුදෙනු**

| අවසර නොලත් ගනුදෙනුවේ විස්තරය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) නඩු අංක CA/WRIT/193/2015 යටතේ දෙන ලද උසාවි තීන්දුව ප්‍රකාරව නීති විරෝධී වූ 2014 නොවැම්බර් 27 දිනැති අංක 2014/GM/46/Pers දරන චක්‍රලේඛය මත මණ්ඩලය වැටුප් ගෙවීම අඛණ්ඩව කරමින් සිටියි. | අධිකරණ නියෝගයට අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳව ගරු නීතිපතිතුමා මතයක් ලබා දී ඇත. මණ්ඩලය ගරු නීතිපතිතුමා විසින් දෙන ලද මතය අනුගමනය කරමින් සිටියි. | මණ්ඩලය අධිකරණ තීන්දු අනුගමනය කළ යුතුය. |
| (ආ) 2007 නොවැම්බර් 14 දිනැති අමාත්‍ය මණ්ඩලය ගන්නා ලද තීරණයට හා 2009 මැයි 26 දිනැති කළමණනාකරණ සේවා චක්‍රලේඛ අංක 39 හි ප්‍රතිපාදන වලට පටහැණිව, අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට වරින් වර විවිධ කාර්ය මණ්ඩල දීමනා ගෙවා තිබුණි. 2019 හා 2018 වර්ෂ වලදී පිළිවෙලින් එකතුව රු.මිලියන 1,712 ක හා රු.මිලියන 1,873 ක එවැනි දීමනා ගෙවා ඇති බව විගණන පරීක්ෂණ වලදී අනාවරණය විය. | අධිකරණ නියෝගයට අනුකූල වන්නේ කෙසේද යන්න පිළිබඳ ගරු නීතිපතිතුමා මතයක් ලබා දී ඇත. මණ්ඩලය ගරු නීතිපතිතුමා විසින් දෙන ලද මතය අනුගමනය කරමින් සිටියි.<br><br>1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ලැයිස්තුගත කර ඇත.<br><br>12(m) වගන්තිය - මණ්ඩලයේ පරිපාලන කටයුතු කිරීම සම්බන්ධව රීති සම්පාදනය කිරීම.<br><br>12(n) වගන්තිය - මණ්ඩලයේ මතය අනුව සිය ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය සියලු දේ කිරීම<br><br>ඒ අනුව, සඳහන් කරන ලද සොයා ගැනීම් සංවිධානයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම සඳහා එහි සේවකයන්ගේ චිත්ත ධෛර්යය නංවාලීමට මණ්ඩලය විසින් ඔවුන්ට ලබා දී ඇති ප්‍රතිලාභවලට, සම්බන්ධ වේ. තවද, මණ්ඩල කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව රීති සැකසීමට පනත මඟින්ම අධ්‍යක්ෂ මණ්ඩලයට බලය සපයා ඇත. | කාර්ය මණ්ඩලයට දීමනා ගෙවීමේ දී මණ්ඩලය චක්‍රලේඛ අවශ්‍යතාවන් වලට අනුකූල විය යුතුය. |
| (ඇ) 1998 මාර්තු 8 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක 130 ප්‍රකාරව, වාහන ණය, සියයට 10 සිට සියයට 14 දක්වා පරාසයක | 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනතේ 12 වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල ලැයිස්තුගත කර ඇත. | මණ්ඩලය සේවකයන්ට පඩි ගෙවීමේදී චක්‍රලේඛ අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතු අතර |

| | | |
|---|---|---|
| පොලී අනුපාතයකට ලබා දීම වෙනුවට, මණ්ඩලය එම ණය සියයට 4.2 ක පොලී අනුපාතයට ලබා දී තිබුණි. තවද, මණ්ඩලය දැඩි ද්‍රවශීලතා ගැටළු වලට මුහුණ දී සිටියද, කිසිදු පාලනයකින් තොරව කාර්ය මණ්ඩල ණය ගෙවා ඇති බව නිරීක්ෂණය විය. | 12(m) වගන්තිය - මණ්ඩලයේ කටයුතු පරිපාලනය සම්බන්ධව රීති සම්පාදනය කිරීම.<br><br>12(n) වගන්තිය - මණ්ඩලයේ මතය අනුව සිය ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාමට පහසුකම් සැලසීමට අවශ්‍ය සියලු දේ කිරීම<br><br>ඒ අනුව, සඳහන් කරන ලද සොයා ගැනීම් සංවිධානයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම සඳහා එහි සේවකයන්ගේ චිත්ත ධෛර්යය නංවාලීමට මණ්ඩලය විසින් ඔවුන්ට ලබා දී ඇති ප්‍රතිලාභවලට, සම්බන්ධ වේ. තවද, මණ්ඩල කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධව රීති සැකසීමට පනත මඟින්ම අධ්‍යක්ෂ මණ්ඩලයට බලය සපයා ඇත. | කිසියම් වෙනස් වීමකදී රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගත යුතුය. |

**1.7** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වත්කම් කළමනාකරණය | | |
| (i) බෙදාහැරීමේ අංශවල ප්‍රාග්ධන වැඩ සම්පූර්ණ කිරීමේ දී දීර්ඝ ප්‍රමාදයක් නිරීක්ෂණය විය. | සම්පූර්ණ කරන ලද කාර්යයන් පැවරීමේ ක්‍රියාවලිය අදාළ පළාත් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී සහ කලාප අතිරේක සාමාන්‍යාධිකාරී විසින් ඔවුන්ගේ විධායක කණ්ඩායම් රැස්වීම්වල සිදු කරනු ලබන එක් නිරන්තර අධීක්ෂණ කටයුත්තකි. | සම්පූර්ණ කරන ලද කාර්යයන් සම්පූර්ණ වන අවස්ථාවේදීම පැවරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |
| (ii) දිවයින පුරා විසිරී ඇති මණ්ඩලය සතු ඉඩම් මැනීම, තක්සේරුකිරීම සහ ආරක්ෂාව සම්බන්ධව ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | මණ්ඩලය සතු ඉඩම් මැනීම සහ තක්සේරු කිරීම කඩිනම් කිරීමට පියවර ගනිමින් සිටී. මණ්ඩලය සතු ඉඩම්වල මැනුම් සලකුණු කිරීම සහ මායිම් ආරක්ෂා කිරීම සඳහා සියලු ශාඛා ප්‍රධානීන්ට උපදෙස් යවා ඇත. 2020 ඔක්තෝබර් 05 වන දිනට මණ්ඩලය සතු ඉඩම් මැනීමේ සහ තක්සේරු කිරීමේ ප්‍රගතියට අනුව, හඳුනාගෙන ඇති මුළු ඉඩම්වලින් සියයට 30 ක් සඳහා තක්සේරු වාර්තා ලැබී ඇත. | මණ්ඩලය සතු ඉඩම් මැනීමේ හා තක්සේරු කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම. |
| (ආ) තොග පාලනය | | |
| (i) විගණනයේදී එක් එක් අංශයේ තොග විෂමතා නිරීක්ෂණය විය. | පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම අනුගමනය කරයි. බෙදාහැරීමේ අංශය ප්‍රමිත මිලකරණ ක්‍රමය අනුගමනය කරන අතර වත්කම් කළමනාකරණ සහ | භාණ්ඩ ලැබීම් සහ නිකුත්කිරීම් නිසි ලෙස සටහන් කළ යුතුය. |

| | | |
|---|---|---|
| | සම්ප්‍රේෂණ අංශ විසින් ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුතු ක්‍රමය භාවිතා කරයි. MITFIN පද්ධතියේ ඉන්වෙන්ටරි මොඩියුලය හරහා සියලුම තොග සම්බන්ධ ගනුදෙනු වාර්තා පවත්වාගෙන යනු ලබයි. | |
| (ii)ගල් අඟුරු තොගයට අදාළව අඛණ්ඩ තොග හිඟයන් සහ අතිරික්තයන් නිරීක්ෂණය විය. | විෂය කරුණු සම්බන්ධයෙන්, වාහක "0" හි ඉලෙක්ට්‍රොනික බර තරාදිය පහත පරිදි නවීකරණය කර ඇත:<br>1. සියලු දිරන ලද / හානියට පත් යාන්ත්‍රික කොටස් ප්‍රතිස්ථාපනය කර ඇත.<br>2. අවශ්‍ය විදුලි / අයි සහ සී කොටස් ප්‍රතිස්ථාපනය කර ඇත.<br>3. අයි සහ සී කොටස සමඟ ගතික ක්‍රමාංකනය සිදු වෙමින් පවතී.<br>4. උපකරණ සැකසීමේ සහ පාලන අංශය ක්‍රියාත්මක වෙමින් පවතී. | ගල් අඟුරු ලද අවස්ථාවේදී මැනිය යුතු අතර සත්‍ය තොග වටිනාකම හඳුනා ගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් අනුගමනය කරමින් වසර අවසානයේදී තොග ගණනය සිදු කළ යුතුය. |
| (ඇ) ව්‍යාපෘති කළමනාකරණය | | |
| ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය. | සියලුම ව්‍යාපෘති ක්‍රියාකාරකම් සහ වාර්තාකරණ අවශ්‍යතා අතිරේක සාමාන්‍යාධිකාරී ව්‍යාපෘති අංශය විසින් අධීක්ෂණය කරනු ලැබේ. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සැළසුම් කළ පරිදි කළ යුතුය. |
| (ඈ) ගිණුම්කරණ පද්ධතිය | | |
| ගිණුම්කරණ පද්ධතියේ පවතින අභ්‍යන්තර පාලනයන්හි ඇති දුර්වලතා හේතුවෙන් 2013 වර්ෂයේ සිට මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන අඛණ්ඩව නැවත සකස් කර තිබුණි. | මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගනු ඇත. | මූල්‍ය ප්‍රකාශන නැවත සකස් කිරීම වළක්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතිය ශක්තිමත් කිරීමට පියවර ගත යුතුය. |
| (ඉ) මෙහෙයුම් අත්පොත | | |
| මණ්ඩලයේ කටයුතු පහසු කිරීම සඳහා අත්පොත් පහක් කාලීනව යාවත්කාලීන කර නොතිබුණි. | මණ්ඩලය අවශ්‍යතාවයට අනුකූල වනු ඇත. | මණ්ඩලයේ කටයුතු පහසු කිරීම සඳහා අත්පොත කාලීනව යාවත්කාලීන කිරීම. |

**1. 8** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1. 8 .1** ලැබිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට රු. 25,985,253,072 ක් වූ වෙළඳ ණයගැති ශේෂය අතුරින්, සාමාන්‍ය සහ තොග සැපයුම්වලට අදාළව රු. 4,359,841,435 ක් වූ ණය ශේෂය වසරකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණු අතර ඉන් රු.**2**,306,048,005 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි. | ඉහත ශේෂය අතුරින් රු.2,649,155,825 ක් නඩු පැවරීමට හෝ හිලව් කිරීමේ ක්‍රියාමාර්ග සඳහා තහවුරු කර ගත් ණය ගැතියන් නියෝජනය කරන අතර ඒ සඳහා යම් කාලයක් ගතවනු ඇත.<br>ඉතිරි ශේෂයෙන් රු. මිලියන 1,051 ක් ආරවුල් නඩු නියෝජනය කරන අතර නිර්දේශ ලබා ගැනීම සඳහා කමිටු පත් කරන ලදි. තවත් රු. මිලියන 530 ක් කපා හැරීම සඳහා කටයුතු ආරම්භ කර ඇත. ඉතිරි ශේෂය බේරුම්කරණය හෝ නීතිමය ක්‍රියාමාර්ග සඳහා යොමු කර ඇත. ඒ අනුව, හිඟ ණය ගැති ශේෂයන් අධීක්ෂණය කිරීමේ සහ අයකර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් මණ්ඩලය සතුව ඇත. | තහවුරු කර ගත් ගනුදෙනුකරුවන් ගෙන් ණය අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් විවිධ ණය ගැතියන්ගෙන් එකතුව රු. 2,635,007,475 ක් වූ ණය ශේෂයන් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකරගෙන නොතිබුණි.<br><br>ණයගැතියාගේ නම / වටිනාකම (රු.) / විස්තරය | | |
| I. මහ භාණ්ඩාගාරය — 225,000,000 — විදි ආලෝකකරණය සහ නඩත්තු කිරීමේ පිරිවැය අයකර ගැනීම. | මහ භාණ්ඩාගාරයට ගෙවිය යුතු උප ණය ආපසු ගෙවීම් මඟින් හිලව් කර ගැනීමට අදාළව භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් ලබා දී ඇති උපදෙස් වලට අනුකූල වීම සඳහා ලැබිය යුතු රු. මිලියන **225** ක මුදල, 2015 වර්ෂයේ සිට මණ්ඩලයේ පොත්වල නිරවුල් කර ගැනීමට නොහැකි විය. | ගනුදෙනුව සිදු වූ අවස්ථාවේදී ඕනෑම කාර්යයක් සඳහා වන වියදම් අය කර ගැනීම සඳහා අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතුය . |
| II. සෝපාන, වායුසමීකරණ සහ විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් රාජ්‍ය ආයතනය වලින් ලැබිය යුතු මුදල් — 120,653,322 | ජනාධිපති මන්දිරයට විදුලි ජනක යන්ත්‍ර සැපයීම වෙනුවෙන් ලැබිය යුතු ආදායමේ වටිනාකම මෙයයි. ජනාධිපති මන්දිරයේ අරමුදල් ඉල්ලීම සම්බන්ධව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් භාණ්ඩාගාර ණය ආපසු ගෙවීමට එරෙහිව හිලව් කර ගන්නා ලෙස මණ්ඩලය වෙත නියම කර ඇත. එබැවින්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දෙන ලද උපදෙස් අනුව කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. | |

| | | | | |
|---|---|---|---|---|
| III. | කෙරිගෙන යන වැඩ ප්‍රාග්ධනය නොවන | 8,601,341 | | රජය සවි කිරීමේ වැඩ වෙනුවෙන් ලැබිය යුතු මුදල මෙමඟින් නියෝජනය කරන අතර මෙම දිගුකාලීන හිඟ ශේෂය නිරවුල් කර ගැනීමට පියවර ගෙන ඇත. |
| IV. | වුඩ් ගෲප් ගෑස් ටර්බයින් ලිමිටඩ් | 8,264,352 | වෙස්ට් කෝස්ට් විදුලි බලාගාරයට පිවිසුම් මාර්ගයක් ඉදිකිරීම සඳහා ගෙවීම. | ලැබීමට ඇත. |
| V. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 6,142,277 | කෙරවලපිටිය ඒකාබද්ධ විදුලි බලාගාරයේ සමාරම්භක උත්සවය සඳහා ගෙවීම. | ලැබීමට ඇත. |
| VI. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය | 897,025,999 | කුඩා ජලවිදුලි සංවර්ධකයින්ට මණ්ඩලය විසින් ගෙවන ලද ගාස්තු ගැලපුම. | ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙතින් ලැබිය යුතු ශේෂය වන රු.897,025,999 ක් කපා හැරීම සඳහා සහකාර මූල්‍ය කළමනාකරු (සම්ප්‍රේෂණ) විසින් මණ්ඩල පත්‍රිකාවක් යොමු කර ඇති බව අනාවරණය වී ඇත. මීට අමතරව, මෙම ගැටළුව සඳහා විමර්ශන කමිටුවක් ද පත් කර ඇත. ලැබීමට ඇත. |
| VII. | AES කැලණිතිස්ස ප්‍රයිවෙට් ලිමිටඩ් | 1,368,961,445 | මිල වෙනස්කම් ගෙවීම් මත අය කර ගත යුතු මුදල. | ලැබීමට ඇත. |
| VIII | නොදර්න් පවර් ප්‍රයිවට් ලිමිටඩ් | 358,739 | 2011 දී සම්පූර්ණ කරන ලද වර්ධන කාර්යය (Augmentation Job) සඳහා අය කර ගත යුතු මුදල. | ලැබීමට ඇත. |
| | එකතුව | 2,635,007,475 | | |

| | | |
|---|---|---|
| (ඇ) ගල් අඟුරු හිඟය සඳහා ලංකා කෝල් කම්පැණි වෙතින් අයවිය යුතු රු. 714,965,435 ක මුදලක් කිසිදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් නොගෙන වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයවිය යුතුව පැවතුණි. | තෝරියන් අයන් සහ ස්ටීල් කම්පැණිට අදාළව රු. 478,179,795 ක් සහ ලිබර්ටි කොමොඩිටීස් කම්පැණිට අදාළව රු. 236,785,639.43 ක් ලෙස මෙම ශේෂය සමන්විත වේ. ටෝරියන් අයන් හිඟ ණය ශේෂයට අදාළව කැබිනට් කමිටුවක් පත් කරන ලද අතර එහි අවසන් වාර්තාව වරාය හා නාවික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම් වෙත භාර දෙන ලදි. | පිරිවැය අය කර ගැනීමට සහ ආවශ්‍යක පිරිවැය වළක්වා ගැනීමට වහාම නීතිමය පියවර ගත යුතුය. |

| | | |
|---|---|---|
| | ලිබර්ටි කොමොඩිටීස් සම්බන්ධයෙන් ලංකා කෝල් කම්පැණි විසින් බේරුම්කරණ ක්‍රියාවලියක් ආරම්භ කර ඇත ලිබර්ටි කොමොඩිටීස් සමාගමට එරෙහිව ලංකා කෝල් කම්පැණි විසින් ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ගවලින් පසුව මෙම ශේෂය නිරවුල් වනු ඇත. | |
| (ඇ) වත්කම් කළමනාකරණ අංශයේ වෙනත් ලැබිය යුතු මුදල් යටතේ පෙන්වන ලද රු. 151,421,219 ක් වසර පහකට වැඩි කාලයක් තිස්සේ අයකර ගැනීමෙන් තොරව පැවතුණි. එම මුදලින් රු . 142,477,285 ක් රජයේ ආයතනවලින් අයකර ගත යුතු අතර ගනුදෙනුවල ආරම්භක අවධියේදී අයකර ගැනීමට අවශ්‍ය පියවර මණ්ඩලය විසින් අරගෙන නොතිබුණි. | කරුණුවල වැදගත්කම මත පදනම්ව අමාත්‍යාංශයේ හෝ මණ්ඩලයේ උසස් නිලධාරීන්ගේ නියෝග මත මෙම සියලු කාර්යයන් සිදු කර ඇත. හිඟ මුදල් පියවන ලෙස ඉල්ලා අදාළ ආයතන වෙත දැනටමත් සිහිකැඳවීමේ ලිපි යවා ඇති අතර හිඟ මුදල් ලබා ගැනීම සඳහා පසු විපරම් කරන ලෙස අදාළ ඒකක ප්‍රධානීන් සහ ගණකාධිකාරී (ඩබ්ලිව් ඇන්ඩ් ඒඑස්) වෙත දැනුම් දී ඇත. බොහෝමයක් වූ හිඟ ශේෂ විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයෙන් සහ රජයේ රෝහල්වලින් ලැබිය යුතුව ඇත.<br><br>වර්තමානයේ දී, අතිරේක සමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණය) විසින් ලබා දී ඇති මඟ පෙන්වීම අනුව කාර්යයක් භාරගැනීමට පෙර මණ්ඩලය විසින් පාලන ක්‍රියා පටිපාටියක් අනුගමනය කරන අතර අයවිය යුතු ගෙවීම් නිරන්තරයෙන් අධීක්ෂණය කරනු ලැබේ. | ගනුදෙනුව සිදු වූ අවස්ථාවේදී ලැබිය යුතු මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. |

**1. 8 .2** ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | | | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට එකතුව රු. 4,947,283,160 ක් වූ පහත සඳහන් ණය ශේෂයන් වසර පහකට වැඩි කාලයක් තිස්සේ පියවා නොතිබුණි. | | | | සේවා සපයන්නන් සමඟ කිසියම් ආරවුලක් ඇති වීම වළක්වා ගැනීම සඳහා වගකීම් පියවීමට පියවර ගත යුතුය. |
| | ණයහිමියාගේ නම | වටිනාකම<br>රු . | | |
| i. | රේගුව | 1,065,828 | රු.**4,**947,283,160 ක් අතුරින් රු.1,065,828 ක් 2017/2018 ගල් අඟුරු කාලයට අදාළව ගල් අඟුරු සමාගමට ගෙවිය යුතු ප්‍රමාද ගාස්තු වේ. එය 2020 දී නිරවුල් කෙරේ. | |
| ii. | චීන යන්ත්‍රෝපකරණ ඉංජිනේරු සංස්ථාව | 3,596,324,467 | චයිනා මැෂිනරි ඉංජිනියරින් කෝපරේෂන් හට (CMEC) ගෙවිය යුතු රු. 3,596,324,467 ක් ඉහත ශේෂයට ඇතුළත් වේ. 2014 සහ 2015 වර්ෂයන්ට අදාළ චයිනා මැෂිනරි ඉංජිනියරින් කෝපරේෂන් හි හිඟ ශේෂ පියවා ඇත. 2016, 2017 සහ 2018 වර්ෂයන්ට අදාළ ගෙවීම් පියවිය යුතුව ඇත. වර්තමාන අහිතකර මූල්‍ය තත්ත්වය හේතුවෙන් මණ්ඩලය විසින් මාසයකට ඇමරිකානු ඩොලර් මිලියන 2 ක් පමණක් නිදහස් කරනු ලබයි. | |
| iii. | ගෙවිය යුතු සංස්ථා බද්ද | 1,270,766,413 | 2013/2014 තක්සේරු වර්ෂය සඳහා වූ "ගිණුම්කරණ ලාභය" මත පදනම්ව තීරණය කරන ලද පදනම් වගකීම මත ගෙවිය යුතු රු.1,270,766,413 ක් වූ ලාභාංශ බද්ද සම්බන්ධව මණ්ඩලය විසින් දේශීය ආදයම් දේපාර්තමේන්තුව සමඟ සාකච්ඡාවකට ලක් කර ඇති අතර මේ සම්බන්ධයෙන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සහ මහ භාණ්ඩාගාරය සමඟ සාකච්ඡා කිහිපයක් පවත්වන ලදී. මෙම කාරණය තවමත් විසඳී නොමැති හෙයින්, 2020 ජූනි **08** දිනැති හා අංක FM (AFM (HQ)/DFM(TAX) /Deemed Dividend Tax දරණ ලිපිය මඟින් මණ්ඩලයේ සභාපති විසින් මෙම ගැටළුව විසඳීම සඳහා මහ භාණ්ඩාගාර ලේකම්ගේ මැදිහත්වීම ඉල්ලා සිටී. | |

| | | | |
|---|---|---|---|
| iv. | ප්‍රාග්ධන වියදම | **10,**928,756 | රු.10,928,756 යනු උතුරු පළාතේ නියෝජ්‍ය සමාන්‍යාධිකාරී කාර්යාල සංකීර්ණය සඳහා ගෙවිය යුතු අවසාන ගෙවීමයි. කැබිනට් අනුපාත කමිටුවේ අනුමැතිය නොලැබීම හේතුවෙන් මෙම ගෙවීම පියවිය යුතුව පවති. |
| v. | පුත්තලම් ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ උපචිත වියදම් ඇතුළු විවිධ ණයහිමියන් | 68,197,696 | රු.4,947,283,160 ක් අතුරින් රු. 68,197,696 ක් පුත්තලම ගල් අඟුරු බලාගාර ව්‍යාපෘතියේ උපචිත වියදම් වේ. මෙම මුදල වර්තමාන වර්ෂයේ ගිණුම්වල ගැලපීමට පියවර ගනු ලැබේ. |
| | එකතුව | 4,947,283,160 | |

| | | |
|---|---|---|
| (ආ)වර්ෂයකට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව රු.3 ,371,599,434 ක මුදලක් සම්ප්‍රේෂණ අංශයේ වෙළඳ ණය හිමියන් ලෙස දක්වා තිබුණි. | එම හිඟ ශේෂයන් පියවීමේ හැකියාව තහවුරු කර ගැනීමට පියවර ගෙන ඇත. වාර්තාවලටඅනුව, රු.බිලියන 3.3 අතුරින් රු.බිලියන 3.1 ක් ස්වාධීන විදුලිය මිලදී ගැනීම්වලට අදාළ මතභේදයට තුඩුදෙන ඉන්වොයිසි නියෝජනය කරයි. සුදුසු ගිණුම්කරණ පිළියමක් ඇගයීම සහ සොයා ගැනීම සඳහා මෙම ඉන්වොයිසි අධ්‍යයනය කරයි. | සැපයුම්කරුවන් සමඟ ආරවුල් ඇතිවීම වළක්වා ගැනීම සඳහා වගකීම් පියවීමට පියවර ගත යුතුය. |

**1. 9 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදිය අනුකූල නොවීම.**

---

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ 28 (3 ) වගන්තිය | පනතේ නිශ්චිතව දක්වා ඇති පරිදි මණ්ඩලය පාරිභෝගික තැන්පතු සඳහා පොලිය ගෙවා නොමැති අතර 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් වාර්තා කරන ලද අනුපාතය මත පදනම්ව විගණනය මඟින් කරන ලද ගණනය කිරීම්වලට අනුව ඒ සඳහා ගෙවිය යුතු පොළිය රු. මිලියන 1,592 ක් වූ අතර 2019 දෙසැම්බර් 31 වන දිනට නොගෙවූ සමුච්ඡිත පොළිය රු.මිලියන 5,118 කි. | 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 3(ඈ) සහ අංක 30 වගන්තියට අනුව, විදුලි ගාස්තු ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් එවිය යුතුය. කෙසේ වෙතත් පවත්නා විදුලි ගාස්තු මඟින් මණ්ඩලයේ ව්‍යාපාර කටයුතු කරගෙන යාමට ප්‍රමාණවත් මුදල් උත්පාදනය නොවේ. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ; 3(1) කොමිෂන් සභාවේ කර්තව්‍ය විය යුත්තේ ශ්‍රී ලංකාව තුළ විදුලි කර්මාන්තය සඳහා ආර්ථික, තාක්ෂණික හා ආරක්ෂණ නියාමක වශයෙන් ක්‍රියා කිරීම සහ | මණ්ඩලය පනතේ අවශ්‍යතාවයන් ට අනුකූල විය යුතුය. |

(ඇ) ස්වකීය පාරිභෝගිකයින්ට වඩාත් ආර්ථිකමය සහ කාර්යක්ෂම සේවයක් ලබාදීම සහතික කිරීමේ අරමුණින් බලපත්‍රලාභීන් හා වෙනත් විදුලිබල ව්‍යාපාරවලින් අය කරනු ලබන ගාස්තු සහ වෙනත් අයකිරීම් නියාමනය කිරීම;

30(1) වගන්තිය විදුලි බලය, සම්ප්‍රේෂණය කිරීම හා තොග විකිණීම සඳහා සම්ප්‍රේෂණ කිරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයක්‍රම හෝ ගාස්තු (මෙතැන් සිට "සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයක්‍රම" ලෙස හැඳින්වේ); සහ විදුලි බලය බෙදා හැරීම හා සැපයීම සඳහා බෙදාහැරීමේ බලපත්‍රලාභියා විසින් අය කරනු ලබන අයක්‍රම හෝ ගාස්තු (මෙතැන් සිට "බෙදාහැරීමේ හා සැපයීමේ අයක්‍රම" ලෙස හැඳින්වේ);
සම්බන්ධයෙන් අදාළ විය යුතුය.

(2) සම්ප්‍රේෂණය කිරීමේ හා තොග විකිණීමේ අයක්‍රම සහ බෙදා හැරීමේ හා සැපයීමේ අයක්‍රම අදාළ බලපත්‍රයේ සඳහන් කොන්දේසිවලට අනුකූලව -

කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද පිරිවැය ප්‍රත්‍යවේක්ෂක ක්‍රමවේදයකට අනුකූලව අදාළ බලපත්‍රලාභියා විසින් සකස් කරනු ලැබිය යුතු ය;

කාර්යක්‍ෂම පදනමක් මත, එහි බලපත්‍රය මඟින් බලය දී ඇති ක්‍රියාකාරකම් කරගෙන යාමේදී දරන ලද සියලු සාධාරණ වියදම්, ආපසු අයකර ගැනීම සඳහා අදාළ බලපත්‍රලාභියාට අවසර දෙනු ලැබිය යුතු ය;

5 වන වගන්තිය යටතේ කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති මාර්ගෝපදේශ ප්‍රකාර කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබිය යුතු ය; තවද

මහජනතාවගේ දැනගැනීම සහතික කිරීම උදෙසා කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබිය හැකි ආකාරයට ප්‍රකාශයට පත් කළ යුතු ය.

2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තියට අනුව සෑම බෙදාහැරීමේ බලපත්‍රයක්ම සිය ගනුදෙනුකරුවන්ට සුරැකුම් තැන්පතු සඳහා පොළිය ගෙවිය යුතුය. පනතේ අදාළ වගන්තිය පහත පරිදි වේ.

28 (3) වගන්තිය "ඇප මුදලක් වශයෙන් යම් මුදල් ප්‍රමාණයක් බෙදා හැරීමේ බලපත්‍රලාභියෙකු වෙත තැන්පත් කරනු ලැබූ අවස්ථාවක ඒ මුදල ඒ බලපත්‍රලාභියා සතුව පවත්නා කාලපරිච්ඡේදය සඳහා කොමිෂන් සභාවේ අනුමැතිය ඇතිව බලපත්‍රලාභියා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි යම් අනුපාතයකට අනුව බලපත්‍රලාභියා විසින් ඒ මුදල් ප්‍රමාණය මත පොලියක් ගෙවනු ලැබිය යුතුය."

වර්තමානයේදී මණ්ඩලය වෙත සිය ව්‍යාපාරය පවත්වාගෙන යාමට ප්‍රමාණවත් මුදල් නොලැබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙස මණ්ඩලය විසින් සිය ගනුදෙනුකරුවන්ගේ සුරැකුම් තැන්පතු සිය කාරක ප්‍රාග්ධනයේ කොටසක් ලෙස භාවිතා කරන අතර අවශේෂ කාරක ප්‍රාග්ධනය බැංකු අයිරා, කෙටිකාලීන ණය ආදියෙන් ලබා ගනී.

මණ්ඩලය විසින් සිය ගනුදෙනුකරුවන්ගේ සුරැකුම් තැන්පතු එහි කාරක ප්‍රාග්ධනය ලෙස භාවිතා කිරීමෙන් ලබා ගන්නා ප්‍රතිලාභ, එනම් බැංකු අයිරා මත පොළිය ඉතිරි වීම, ගාස්තු අඩු කිරීම මගින් සියළුම පාරිභෝගිකයින් අතර බෙදා හරිනු ලැබේ. වෙනත් වචන වලින් කිවහොත්, 2018 වර්ෂය සඳහා මණ්ඩලය සිය ගනුදෙනුකරුවන් අතර රු. මිලියන 1,562 කට වඩා වැඩි මුදලක් බෙදා හැර ඇති අතර එය කෙටුම්පත් විගණන වාර්තාවේ දක්වා ඇති ඇස්තමේන්තුගත වටිනාකම වන අතර එය සුරැකුම් තැන්පතු බැංකුවක තැන්පත් කර තිබේ නම් එහිදි උපයා ගත හැකි පොළිය වේ.

මෙම වගන්තියට අනුව බෙදාහැරීමේ බලපත්‍රලාභින් සුරැකුම් තැන්පතු සඳහා පොළිය ගෙවීමට යන්නේ නම් එය බෙදාහැරීමේ බලපත්‍රලාභින් සඳහා අමතර

මූල්‍ය බරක් වන අතර කර්මාන්තයට අමතර පිරිවැයක් වනු ඇත.

එබැවින්, 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනතේ අංක 28 (3) වගන්තිය සම්පූර්ණයෙන් මකාදැමීමට අප විසින් අමාත්‍යාංශය වෙත නිර්දේශ කර ඇති අතර මේ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙස අමාත්‍යාංශයෙන් ඉල්ලා ඇත.

(ආ) 2013 අංක 3 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43 වන වගන්තියේ 4 ඇ (ii) උප වගන්තිය

පනතේ අවශ්‍යතාවයට අනුව ටෙන්ඩර් පටිපාටියක් අනුගමනය නොකර 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුළ මණ්ඩලය විසින් හදිසි විදුලි මිලදී ගැනීම් ( රු.බිලියන **59.4** ක ගිගාවොට් පැය 2,165.51 ක්) සිදු කර ඇති අතර එම බලාගාර සඳහා නියාමකගෙන් උත්පාදන බලපත්‍රය ලබා නොගෙන ක්‍රියාත්මක වේ.

**2013 අංක 31 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධන) පනතේ 43 වන වගන්තියේ 4 ඇ (ii) උපවගන්තිය**
**මණ්ඩලය විසින් පහත සඳහන් කාණ්ඩ දෙක යටතේ 2016 අප්‍රේල් සිට 2019 දෙසැම්බර් දක්වා කාලය තුළ තාප උත්පාදන බලාගාර එකතු කරන ලදි.**

1. ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියාවලිය අනුගමනය කරමින් කෙටිකාලීන පදනමින් අතිරේක විදුලි බලය ප්‍රසම්පාදනය කිරීම.

2. ඉවත් වූ ස්වාධීන බලශක්ති නිෂ්පාදක තාප බලාගාරවලින් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම දීර්ඝ කිරීම.

සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් මුළු ඒකක සහ දරන ලද පිරිවැය පහත පරිදි වේ.

| වර්ෂය | මිලදී ගත් ඒකක ගණන ( ගි.වො.පැය ) | මුළු පිරිවැය (රු. බිලියන) |
|---|---|---|
| 2016 | 442.26 | 11.93 |
| 2017 | 859.43 | 23.57 |
| 2018 | 474.79 | 13.85 |
| 2019 | 734.99 | 22.20 |
| එකතුව | **2,511.47** | **71.56** |

1. කෙටිකාලීන පදනම මත අතිරේක විදුලි බලය ප්‍රසම්පාදනය කිරීම.

මෙම කාණ්ඩය යටතේ ජාත්‍යන්තර තරඟකාරී ලංසු කැඳවීමේ ක්‍රියා පටිපාටීන් අනුගමනය කරමින් පහත සඳහන් ප්‍රසම්පාදන සිදු කර ඇත.

විදුලි බලය ප්‍රසම්පාදනය කිරීමේදී පනතේ අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය.

(i) ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr / 2016/02 (කෙටිකාලීන පදනම මත මෙගාවොට් 60 ක විදුලිය සැපයීම) එකතු කළ ධාරිතාව - මාස හයක් සඳහා මෙගාවොට් 60 ක්

(ii) ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr/**2017/01** (කෙටිකාලීන පදනමක් මත මණ්ඩලය වෙත අතිරේක විදුලි බලය සැපයීම) එකතු කළ ධාරිතාව - මාස **6** ක් සඳහා මෙගාවොට් **56**

(iii) ටෙන්ඩර් අංකය. DGM (EPT) / EmPwr/ 2019/01 (කෙටිකාලීන පදනම මත මෙගාවොට් **100** ක අතිරේක විදුලි බලය සැපයීම) එකතු කළ ධාරිතාව - මාස **6** ක් සඳහා මෙගාවොට් **100**

2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 43 වන වගන්තියට අනුකූලව මෙම සියලු ප්‍රසම්පාදන සිදු කර ඇත.
සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් මුළු ඒකක සහ දරන ලද පිරිවැය පහත පරිදි වේ.

| වර්ෂය | මිලදී ගත් ඒකක ගණන ( ගි.වො.පැය ) | මුළු පිරිවැය (රු. බිලියන) |
|---|---|---|
| 2016 | - | - |
| 2017 | 167.03 | 5.39 |
| 2018 | 36.80 | 1.96 |
| 2019 | 142.13 | 5.06 |
| එකතුව | **345.96** | **12.41** |

2 ඉවත් වූ ස්වාධීන බල ශක්ති නිෂ්පාදක තාප බලාගාරවලින් බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම.

මෙම වර්ගීකරණය යටතේ, ඉවත් වූ ස්වාධීන බල ශක්ති නිෂ්පාදක තාප විදුලි බලාගාරවලින් විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම් පහත සඳහන් පරිදි දීර්ඝ කර ඇත. නියමිත කාල සීමාව ඉකුත්වී ඇති බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ

කිරීම සඳහා 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල (සංශෝධිත) පනතේ 43 වන වගන්තියෙන් කිසිදු නීතිමය බාධාවක් අප හඳුනාගෙන නොමැත.

i. ඒස් පවර් ඇඹිලිපිටිය ප්‍රයිවට් ලිමිටඩ් මෙගාවොට් 100 ක බලාගාරය.
   අ. 2016 අප්‍රේල් 06 සිට වසරක්
   ආ. 2017 අප්‍රේල් 06 සිට වසරක්
   ඇ. 2018 අප්‍රේල් 06 සිට අවුරුදු තුනක්

ii. ඒස් පවර් ජෙනරේෂන් මාතර ප්‍රයිවට් ලිමිටඩ් මෙගාවොට් 20 ක බලාගාරයක්.
   අ. 2017 මාර්තු 25 සිට වසරක්
   ආ. 2019 අප්‍රේල් 08 සිට අවුරුදු දෙකක්

iii. ඒෂියා පවර් ප්‍රයිවෙට් ලිමිටඩ් මෙගාවොට් 50 ක බලාගාරය.
   අ. 2019 අප්‍රේල් 12 සිට අවුරුදු දෙකක්

ඒස් පවර් ඇඹිලිපිටිය බලාගාරයට අදාළව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් මුළු ඒකක සහ දරන ලද පිරිවැය පහත පරිදි වේ.

| වර්ෂය | මිලදී ගත් ඒකක ගණන ( ගි.වො.පැය ) | මුළු පිරිවැය (රු. බිලියන) |
|---|---|---|
| 2016 | 358.74 | 8.48 |
| 2017 | 513.34 | 11.84 |
| 2018 | 362.84 | 9.16 |
| 2019 | 460.92 | 12.70 |
| එකතුව | **1,695.85** | **42.18** |

ඒස් පවර් ජෙනරේෂන් මාතර බලාගාරයට අදාළව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් මුළු ඒකක සහ දරන ලද පිරිවැය පහත පරිදි වේ.

| වර්ෂය | මිලදී ගත් ඒකක ගණන ( ගි.වො.පැය ) | මුළු පිරිවැය (LKR බිලියන) |
|---|---|---|
| 2016 | - | - |
| 2017 | 62.29 | 1.64 |
| 2018 | 19.55 | 0.51 |
| 2019 | 53.20 | 1.74 |
| එකතුව | **135.05** | **3.89** |

ඒෂියා පවර් බලාගාරයට අදාළව සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ මිලදී ගත් මුළු එකක සහ දරන ලද පිරිවැය පහත පරිදි වේ.

| වර්ෂය | මිලදී ගත් ඒකක ගණන ( ගි.වො.පැය ) | මුළු පිරිවැය (රු. බිලියන) |
|---|---|---|
| 2016 | 83.52 | 3.45 |
| 2017 | 116.76 | 4.69 |
| 2018 | 55.59 | 2.22 |
| 2019 | 78.73 | 2.70 |
| එකතුව | **334.61** | **13.07** |

| | | | |
|---|---|---|---|
| (ඇ)1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ 46 සහ 11 (අ) සහ (ආ) වගන්ති | 2019 දෙසැම්බර් 31 දිනට ඉන්ෂුවරන්ස් එස්ක්‍රෝ ෆන්ඩ් හි මණ්ඩලය විසින් රු. මිලියන 8,996 ක් පමණක් ආයෝජනය කර තිබුණි. එහෙත් 1989 සිට සෑම වර්ෂයක් අවසානයේ දී දළ ස්ථාවර වත්කම්වල මුළු වටිනාකමෙන් සියයට 0.1 ක දායකත්වයක් එම අරමුදලට මාරු කළ යුතු බව සඳහන් වේ. | මණ්ඩලය විසින් වසර ගණනාවක් තිස්සේ අයහපත් මුදල් ප්‍රවාහ තත්වයක් අත්විඳීම හේතුවෙන් ඉන්ෂුවරන්ස් ඉන්වෙස්ට්මන්ට් එස්ක්‍රෝ ගිණුමේ ආයෝජනය නොකිරීම මෙම වෙනස ඇතිවීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. කෙසේ වෙතත්, මණ්ඩලයේ ද්‍රවශීලතා තත්ත්වය සහ මුදල් ප්‍රවාහ වැඩි දියුණු වූ පසු රක්ෂණ සංචිත ආයෝජන ගිණුමේ දළ ස්ථාවර වත්කම්වලින් සියයට 0.1 කට සමාන ආයෝජනයක් කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් පදනම සැලකිල්ලට ගනිමින්, වත්කම් සඳහා වන පාඩු පියවා ගැනීම සඳහා සංචිතය පවත්වා ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද පීඊඩී 12 චක්‍රලේඛයේ 9.4 වගන්තිය | පීඊඩී **12** චක්‍රලේඛයේ **9.4** වගන්තියට පටහැනිව, මණ්ඩලය රු.**49,138,383** ක් වැටුප් සහ අනෙකුත් ගෙවීම් ලෙස **2008** සිට රේඛීය අමාත්‍යාංශය සඳහා වරින් වර නිදහස් කරන ලද සේවකයන් **26** ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළදී ගෙවා ඇති අතර එම මුදල **2020** සැප්තැම්බර් **30** දිනට ප්‍රතිපූරණය කර නොතිබුණි. | සිය සේවකයින් නිදහස් කරන ලෙස රේඛීය අමාත්‍යාංශය විසින් කරන ලද ඉල්ලීම් බැහැර කිරීමට මණ්ඩලයට හැකියාවක් නොමැති හෙයින්, ඒ සඳහා වන වියදම් මණ්ඩලයට පාලනය කළ නොහැක. | චක්‍රලේඛයේ අවශ්‍යතාවයට අනුකූල වීම. |

**1. 10** බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැටුප් සංශෝධනය කරන අවස්ථාවකදී **2007** දෙසැම්බර් **13** වන දින කැබිනට් මණ්ඩලය විසින් ගෙන ඇති තීරණය සහ 2015 මැයි 20 වන දින සාමූහික ගිවිසුම සලකා බලන විට, උපයන විට ගෙවීම් බදු වගකීම සේවකයින් වෙත මාරු කර තිබුණි. කෙසේවෙතත්, 2010 සිට 2019 දක්වා කාල සීමාව තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ ඉහත තීරණවලට සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක **2016/3** දරන චක්‍රලේඛයට පටහැනිව අදාළ සේවකයින්ගේ වැටුපෙන් අඩු නොකර මණ්ඩලය විසින් සිය අරමුදලෙන් රු.4,919,156,644 ක උපයන විට ගෙවීම් බදු ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එසේ ගෙවා ඇති මුදල රු. 709,110,273 කි. | මණ්ඩලයේ සේවකයින්ගේ උපයන විට ගෙවීම් බදු වගකීම මණ්ඩලය විසින් දරනු ලබන්නේ එහි සේවකයින් උපයන විට ගෙවීම් බද්දට බැඳී ඇති හෙයිනි. මෙය විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයට හා වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවට කිහිප වතාවක්ම දැනුම් දුන් අතර වෘත්තීය සමිති සමඟ ද සාකච්ඡා පැවැත්විණි. කෙසේ වෙතත්, එය නැවත සේවකයින් වෙත පැවරීම සම්බන්ධයෙන් එකඟතාවකට පැමිණියේ නැත. 2018 ජනවාරි 04 දින අත්සන් කරන ලද සාමූහික ගිවිසුම 2018 අප්‍රේල් 23 දිනැති අංක 2068/5 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත් කර ඇත. එකඟ වූ පාරිශ්‍රමිකය වෙනස් කිරීම සාමූහික ගිවිසුම උල්ලංඝනය කිරීමක් ලෙස පෙනී යන අතර එය තවදුරටත් නීතිමය ප්‍රතිවිපාක ඇති කරයි. | සේවකයින්ගෙන් උපයන විට ගෙවීම් බදු අය කර ගැනීමට පියවර ගත යුතුය. |
| (ආ) 2001 මැයි 20 දිනැති ගැසට් නිවේදන අංක 1706/18 මගින් දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් විසින් නිශ්චිතව දක්වා ඇති මුදල් නොවන ප්‍රතිලාභවල වටිනාකම එක් එක් සේවකයාගේ උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී සලකා බැලිය යුතුය. කෙසේවෙතත්, නිල නිවාස, මහල් නිවාස සහ පුද්ගලික භාවිතය සඳහා | උපයන විට ගෙවීම් බදු ගණනය කිරීම සඳහා නිල නිවාස, මහල් නිවාස සහ පුද්ගලික භාවිතය සඳහා මෝටර් වාහන වැනි මුදල් නොවන ප්‍රතිලාභ යොදා ගන්නා ලෙස 2018/GM/39/FM, ගිණුම් චක්‍රලේඛ අංක 526 හරහා උපදෙස් ලබා දී ඇත. 2018 දී නව දේශීය ආදායම් පනත ක්‍රියාත්මක කිරීමත් සමඟ උපදෙස් නිකුත් කර ඇති බැවින්, මණ්ඩලයේ සියලුම අංශ | PAYE බදු ගණනය කිරීමේදී සියළුම මුදල් නොවන ප්‍රතිලාභ සලකා බැලීමට පියවර ගත යුතුය. |

මෝටර් වාහන සැපයීම වැනි මුදල් විසින් මෙයට අනුකූල වීමට සාධාරණ නොවන ප්‍රතිලාභ මණ්ඩලය විසින් කාලයක් ගතවනු ඇත. උපයන විට ගෙවීම් බදු ගණනය කිරීමේදී සැලකිල්ලට ගෙන නොතිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශයන්ට අනුව, සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන **73,367** ක බදු පෙර අලාභයක් වූ අතර ඊට සාපේක්ෂව පසුගිය වර්ෂයේ බදු පෙර අලාභය රු. මිලියන **22,395** ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන **50,972** ක අඩුවීමක් සමාලෝචිත වර්ෂයේදී පිළිබිඹු විය. ජල විදුලි උත්පාදනය සියයට 25 කින් අඩුවීම හේතුවෙන් ඉන්ධන පිරිවැය, ගල් අඟුරු සහ බලශක්ති මිලදී ගැනීම් පිළිවෙලින් සියයට 28 කින්, සියයට 20 කින් සහ සියයට 40 කින් වැඩි වීම සහ උත්පාදන අංශයේ මෙහෙයුම් හා නඩත්තු වියදම් සියයට 16 කින් වැඩි වීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. තවද මූල්‍ය පිරිවැය රු. මිලියන **9,**489 කින් හෙවත් සියයට 73 කින් වැඩි වීම මෙම පිරිහීමට තවත් හේතුවක් විය.

කෙසේවෙතත්, සේවක පාරිශ්‍රමිකය, බදු වියදම සහ ක්ෂයවීම්වල එකතුව වන රු. මිලියන 100,214 ක් සැලකිල්ලට ගත් පසු සමාලෝචිත වර්ෂය සඳහා මණ්ඩලයේ අගය එකතු කිරීම රු. මිලියන 37,406 ක් වූ අතර එය පසුගිය වසරට සාපේක්ෂව රු. මිලියන 39,285 කින් හෙවත් සියයට 51 කින් වැඩි වී තිබුණි.

### 2 .2 අනුපාත විශ්ලේෂණය

#### 2 .2.1 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ කාරක ප්‍රාග්ධනය රු. මිලියන 90, 673 ක සෘණ අගයක් ලෙස පිළිබිඹු වූ අතර පසුගිය වර්ෂයේ සෘණ ශේෂය රු. මිලියන 28,924 ක් විය. එබැවින්, සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 213 කින් අඩු වී තිබුණි.

#### 2 .2.2 ස්කන්ධයට ණය

මණ්ඩලයේ අඛණ්ඩ ශුද්ධ අලාභය හේතුවෙන් සියයට 8 අනුරූපී අඩුවීමට සාපේක්ෂව 2019 දෙසැම්බර් 31 දිනට මණ්ඩලයේ ස්කන්ධ ශේෂය රු. මිලියන 63,846 කින් හෙවත් සියයට 19 කින් අඩු වී තිබුණි. තවද, 2018 දෙසැම්බර් 31 දිනට මණ්ඩලය විසින් යොදවා ඇති මුළු ප්‍රාග්ධනයෙන් සියයට 37 ක් හෙවත් රු. මිලියන **334**,671 ක් ණය ලබාගැනීම මඟින් මූල්‍යනය කර තිබුණි. තවද, සමාලෝචිත වර්ෂය තුළ මණ්ඩලයේ ස්කන්ධයට ණය අනුපාතය පසුගිය වර්ෂයේ වාර්තා වූ සියයට 88 සිට සියයට 123 දක්වා වැඩි වී තිබුණි.

#### 2 .2.3 ලාභදායීතාවය

සමාලෝචිත වර්ෂයේ ඒකකයක සාමාන්‍ය පිරිවැය රු. **23.29** ක් වූ අතර ඊට සාපේක්ෂව **2018** වර්ෂයේ එය රු. **19.12** ක් විය. ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු.**16.63** ක් විය. (පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය විකුණුම් මිල රු.**16.29** කි). ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ ඒකකයක දළ අලාභය රු. **6.63** ක් වූ අතර පසුගිය වර්ෂයේ ඒකකයක සාමාන්‍ය දළ අලාභය වන රු. **2.83** ට සාපේක්ෂව එය සියයට **134.27** කින් වැඩි වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ විකුණන ලද විදුලිය සඳහා

වන ගාස්තු කාණ්ඩය සහ ඒකකයක ( කි.වො.පැය ) සහභාගය ඉකුත් වර්ෂය සමඟ සංසන්ධනය කර පහත වගුවේ දැක්වේ.

| කාණ්ඩය | ඒකකයක සහභාගය ( කි.වො.පැය ) | |
|---|---|---|
| | **2019** | **2018** |
| | රු . | රු . |
| ගෘහස්ථ | (9.16) | (5.52) |
| ආගමික | (15.98) | (11.84) |
| පොදු අරමුණු | 0.65 | 4.66 |
| හෝටල් | (5.58) | (1.50) |
| කාර්මික | (8.57) | (4.40) |
| රජය | (5.11) | (0.89) |
| LECO වෙත තොග සැපයුම | (10.67) | (3.59) |
| වීදි ආලෝකකරණය | (23.28) | (19.12) |
| සහභාගය | (6.66) | (2.83) |

ඒ අනුව, පොදු අරමුණු යටතේ ගාස්තු කාණ්ඩය පමණක් සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගයට ධනාත්මක දායකත්වයක් කර ඇති අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව සියයට 86 කින් අඩු වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ත සහභාගය සඳහා ඉහළම සෘණාත්මක දායකත්වය ලබා දී ඇත්තේ කාර්මික හා ගෘහස්ථ කාණ්ඩයේ ගාස්තු වන අතර ආගමික, හෝටල්, රජය, LECO වෙත විකුණුම් සහ වීදි ආලෝකකරණය යන ගාස්තු ද අහිතකර දායකත්වයක් පෙන්නුම් කර තිබුණි.

**3 .** මෙහෙයුම් සමාලෝචන

---------------------------

**(i)** විදුලිබල උත්පාදනය සහ සෘජු පිරිවැය (බෙදා හැරීම සහ සම්ප්‍රේෂණය හැර)

------------------------------------------------------------------------------------

මණ්ඩලයේ ප්‍රධාන පරමාර්ථය වන්නේ අඩු වියදමකින් රටට විදුලිය සැපයීම වුවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල ඇති අහිතකර කොන්දේසි, තාප විදුලිය උත්පාදනය සඳහා අධික පිරිවැයක් දැරීම සහ සුළඟින් හා වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ලැබෙන අඩු දායකත්වය හේතුවෙන් මණ්ඩලයට මෙම අරමුණ සාක්ෂාත් කර ගැනීමට නොහැකි විය.

තවද, මණ්ඩලයේ දිගුකාලීන උත්පාදන සැලැස්මට හා සම්ප්‍රේෂණ සැලැස්මට ඇතුළත් කර ඇති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, මණ්ඩලය විසින් හදිසි විදුලි මිලදී ගැනීම් සිදු කර තිබූ අතර එය මණ්ඩලයේ අවම පිරිවැය පරමාර්ථයට බලපා ඇත.

**2019 දී විදුලිබල උත්පාදනය කිරීමේ තත්ත්වය පසු ගිය වර්ෂය සමඟ සංසන්දනය කර පහත දැක්වේ.**

| මූලාශ්‍රය | 2019 | 2018 | වැඩිවීම/ (අඩුවීම) | |
|---|---|---|---|---|
| | ගි.වො.පැය | ගි.වො.පැය | ගි.වො.පැය | සියයට |
| ජල විදුලිය | 4,795 | 6,381 | (1,586) | (25) |
| තාප | 5,017 | 3,629 | 1,388 | 38 |
| ගල් අඟුරු | 5,361 | 4,764 | 597 | 13 |
| සුළඟ | 348 | 327 | 21 | 6 |
| සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය | 220 | 185 | 35 | 19 |
| වහල මත සූර්ය | 182 | 88 | 94 | 107 |
| එකතුව | **15,923** | **15,374** | **549** | **4** |

ඒ අනුව, සමාලෝචිත වර්ෂය තුළ තාප, ගල් අඟුරු, වෙනත් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය සහ වහල මත සූර්ය පිළිවෙලින් සියයට 38 කින්, සියයට 13 කින්, සියයට 19 කින්, සහ 107 කින් වැඩි වී තිබුණු අතර රටේ කාලගුණ තත්ත්වය අවාසිදායකවීම හේතුවෙන් ජල විදුලි උත්පාදනය සියයට **25** කින් අඩු වී ඇත.

(ii) සෘජු පිරිවැය

**2019** වර්ෂයේ සෘජු පිරිවැය පිළිබඳ ප්‍රභව වශයෙන් විශ්ලේෂණය පසු ගිය වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | 2019 | | 2018 | |
|---|---|---|---|---|
| | රු . මිලියන | ප්‍රතිශතය | රු . මිලියන | ප්‍රතිශතය |
| ඉන්ධන | 53,216 | 21 | 41,553 | 21 |
| ගල් අඟුරු | 46,566 | 19 | 38,823 | 20 |
| බලය මිලදී ගැනීම | 118,665 | 48 | 84,497 | 44 |
| මෙහෙයුම් සහ නඩත්තුව | 16,019 | 6 | 13,812 | 7 |
| ක්ෂයවීම | 14,281 | 6 | 14,744 | 8 |
| සෘජු පිරිවැය | **248,747** | **100** | **193,429** | **100** |

ඉහත තොරතුරු වලට අනුව, ජල විදුලි උත්පාදනය සියයට **25** කින් අඩු වී ඇති බව අනාවරණය වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් **2019** වර්ෂය සඳහා බලය මිළදී ගැනීමේ පිරිවැය, ගල් අඟුරු සහ ඉන්ධන පිරිවැය පසුගිය වසරට සාපේක්ෂව පිළිවෙලින් රු. මිලියන **34,168** කින්, රු. මිලියන **7,743** කින් සහ රු.මිලියන **11,663** කින් හෙවත් සියයට **40** කින්, සියයට **20** කින් සහ සියයට **28** කින් වැඩි වී තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ මෙහෙයුම් හා නඩත්තු පිරිවැය සියයට **16** කින් ඉහළ ගොස් තිබුණි. තවද, විදුලිබල මිලදී ගැනීමේ ගිවිසුම්වල කොන්දේසි අනුව විදුලිබල උත්පාදනය සඳහා වන ස්ථාවර පිරිවැය වළක්වා ගත නොහැකි බව අනාවරණය වූ අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, මහජනතාව වෙත අඩු වියදමකින් විදුලිය සැපයීමේ සිය වැදගත්ම අරමුණ සාක්ෂාත් කර කර ගැනීමට මණ්ඩලයට නොහැකි විය.

**3. 1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ)2019 ඔක්තෝබර් 05 දිනට රු.95,211,376 ක් වටිනා මෙට්‍රික් ටොන් 4,952.85 ක ගල් අඟුරු තොගයේ හිඟයක් හඳුනාගෙන ඇතත් භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලය විසින් භෞතික සත්‍යාපනයක් සිදු කර නොතිබුණි. කෙසේ වෙතත් **2019** දෙසැම්බර් **31** දිනට රු. 456,197,162 ක් වටිනා මෙට්‍රික් ටොන් 28,006.66 ක ගල් අඟුරු තොගයක් අතිරික්තයක් ලෙස ආදායම් ප්‍රකාශනයට ගලපා තිබුණි. එබැවින් 2019 දෙසැම්බර් 31 දිනට පවත්නා ගල් අඟුරු තොගයේ නිරවද්‍යතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | වර්තමානයේ ගල් අඟුරු සත්‍යාපන ක්‍රියාවලිය අධ්‍යන මට්ටමේ පවති ඉහත සඳහන් සාධක **2020** වර්ෂයේ භෞතික තොග ආගණනයේදී සලකා බලනු ලැබේ. | තොග ලද අවස්ථාවේදී ඒවා මැනීම සඳහා ක්‍රියා පටිපාටි ස්ථාපිත කළ යුතු අතර වසර අවසානයේදී භෞතික සත්‍යාපනයක් සිදු කළ යුතුය. |
| (ආ)මණ්ඩලය විසින් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැණි (LECO) වෙත විදුලිය විකිණීම සහ වසර ගණනාවක් තිස්සේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ඉන්ධන මිලට ගැනීම සිදු කර ඇතත්, මෙම ආයතන දෙක අතර සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා එම පාර්ශව දෙක සමඟ විකුණුම් හා මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළඹී නොතිබුණි. | නීති නිශ්කාෂණයක් සමඟ පාර්ශව දෙකෙහි ඉහළ නිලධාරින් සමඟ ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනි අතර විදුලිය මිලදීගැනීමේ ගිවිසුම සකස් කිරීමට පියවර ගෙන ඇත. කෙසේ වෙතත් මේ දක්වා පාර්ශවයන් අතර ගිවිසුමකට එළඹීමට නොහැකි වී ඇත.<br><br>මේ සම්බන්ධයෙන් **2018** ජූලි **24** වන දිනැති ලිපිය මඟින් ලංකා ඉලෙක්ට්‍රිසිටි කම්පැනිය මඟින් මහජන උපයෝගිතා කොමිෂන් සභාවෙන් සමහර ක්‍රියාමාර්ග ඉල්ලා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය සහ ලංකා ඛණිජ තෙල් සංස්ථාව අතර තෙල් සැපයීමේ ගිවිසුමක් (**FSA**) සැකසීමට සහ අධ්‍යනයට ලංවීම ඉහළ කළමනාකරණය විසින් කමිටුවක් පත් කර තිබේ. | මෙම සංවිධාන අතර ආරවුල් ඇතිවීම වැළැක්වීම සඳහා ගිවිසුමකට එළඹිය යුතුය. |
| (ඇ) අරමුදල් කාලිනව උපයෝජනය නොකිරීම හේතුවෙන් මණ්ඩලයේ විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ලබා දී ඇති ණය වලින් බැදීම් ගාස්තු ලෙස 2019 දී රු.134,447,792 ක මුදලක් ණය දෙන ආයතනය විසින් අඩු කර තිබුණි. කෙසේ | බැඳීම් ගාස්තු සියලු ව්‍යාපෘති සඳහා පොදු වන අතර ණය ගිවිසුම්වල ඇති දැඩි ණය ගිවිසුම් හේතුවෙන් ව්‍යාපෘතිය සැලැසුම් කළ පරිදි සිදු වුවද එය වළක්වා ගත නොහැක. | අතිරේක බැඳීම් ගාස්තු මග හැරීම සඳහා සැලසුම් කර ඇති පරිදි ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කළ යුතුය. |

වෙතත්, ගණනය කිරීම් ලබා ගැනීමට නොමැති බැවින් බැඳීම් ගාස්තු වල නිරවද්‍යතාවය සත්‍යාපනය කළ නොහැක.

බැඳීම් සහ පොලී ගාස්තු, ලේඛණයේ පළමු ව්‍යාපෘති තුන සඳහා වන ණය මුදලෙහි කොටසක් නොවන අතර මහ භාණ්ඩාගාරය රජය වෙනුවෙන් බැඳීම් ගාස්තු දරනු ලබයි. මණ්ඩලය වශයෙන්, මහ භාණ්ඩාගාරය විසින් දැනුම් දෙන තුරු එවැනි බැඳීම් ගාස්තු වාර්තා කිරීමට අපට හැකියාවක් නැත. මේ අනුව, මහ භාණ්ඩාගාරයෙන් තොරතුරු ලබා නොගෙන සංඛ්‍යා සත්‍යාපනය කළ නොහැක.

ඉතිරි ව්‍යාපෘති සඳහා, විදේශ සම්පත් දෙපාර්තමෙන්තුවේ ප්‍රකාශනවලින් උපුටා ගත් පසු බැඳීම් ගාස්තු ගිණුම් පොත්වල සටහන් කර ඇත. බැඳීම් ගාස්තු මෙම ව්‍යාපෘති සඳහා වන ණය මුදලෙහි කොටසක් වන අතර ණය දෙන ආයතන විසින් ලබා දෙන ණය මුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රකාශනවල දක්වා ඇත. කෙසේ වෙතත්, සමහර ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති අංශ ගිණුම්වල දක්වා ඇති සංඛ්‍යා විගණකවරුන්ගේ සංඛ්‍යා සමඟ නොගැලපෙන බව නිරීක්ෂණය විය. සමහර ව්‍යාපෘතිවල බහු සංරචක හා කොටස් ඇති නිසාත්, විවිධ සංරචක / කොටස් හසුරුවනු ලබන්නේ මණ්ඩලයේ විවිධ අංශයන් විසින් වීම මෙයට හේතුවක් විය හැක. එබැවින් විගණක විසින් පෙන්වන ලද සංඛ්‍යා, ව්‍යාපෘතිවල විවිධ කොටස් ඒකාබද්ධ කරන ලද සමුච්චිත සංඛ්‍යාවක් විය හැකිය.

(ඇ) 2018 - 2037 දිගුකාලීන ජනන පුළුල් කිරීමේ සැලැස්මට අනුව, තාපයෙන් මෙගාවොට් 370 ක් සහ පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 287 කින් සමන්විත මෙගාවොට් 657 ක නව උත්පාදනයක් ජාතික පද්ධතියට එක් කළ යුතුය. කෙසේ වෙතත්, සැලසුම් වලට ඇතුලත් නොවූ ආකාර වලින් තාපයෙන් මෙගාවොට් 222 ක් සහ පුනර්ජනනීය බලශක්තියෙන් මෙගාවොට් 25.25 ක් පමණක් සමාලෝචිත වර්ෂය තුලදී පද්ධතියට එකතු

පහත සඳහන් හේතු නිසා යෝජිත විදුලි බලාගාර ප්‍රමාද වී ඇත.

• බටහිර කලාපයේ පිහිටි එල්එන්ජී fired Combined Cycle විදුලි බලාගාරය.

මුලදී, උසාවි නඩුවක් හේතුවෙන් ප්‍රමාද විය. කැමැත්ත ප්‍රකාශ කිරීමේ ලිපිය (LOI) නිකුත් කිරීමටත්, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ

අවම පිරිවැය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මණ්ඩලය විසින් අවම පිරිවැය දිගු කාලීන ජනන සැලැස්මට අනුකූල විය යුතුය.

කර තිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන්, සමාලෝචිත වර්ෂය තුලදී රු. බිලියන 22.2 ක් වටිනා ගිගාවොට් පැය 735 ක හදිසි විදුලිබලයක් ලෙස මිලදී ගෙන තිබුණි.

අනුමැතිය සහිතව ලක්දනව් ලිමිටඩ් සමඟ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමකට එළඹීමටත් මණ්ඩලය වෙත බලය ලබා දීමේ කැබිනට් අනුමැතිය 2020 පෙබරවාරි මාසයේදී ලැබී ඇත. ව්‍යාපෘති කමිටුව ලක්දනව් ලිමිටඩ් සමඟ සාකච්ඡා කර වාර්තාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයට සහ සීඒන්සී වෙත ඉදිරිපත් කර ඇත. මෙම ලේඛනය කැබිනට් මණ්ඩලය විසින් පත් කරන ලද විශේෂ කමිටුවක් විසින් සමාලෝචනය කරන ලද අතර කමිටුවේ වාර්තාව විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කර ඇත.

• ගෑස් ටර්බයින ටෙන්ඩර් කිරීම සිදු කරන ලදි. තාක්ෂණික ඇගයීම් කමිටු වාර්තාව (TEC) ඉදිරිපත් කර ඇත. එම වාර්තාව සලකා බැලීමෙන් පසු, කැබිනට් මණ්ඩලය විසින් පත්කරන ලද ප්‍රසම්පාදන කමිටුව (SCAPC) විසින් අරමුදල් සුරක්ෂිත කරන ලෙස සහ ප්‍රසම්පාදනය පිළිබඳ තීරණයක් ගැනීම සඳහා දැනුම් දෙන ලෙස 2016 අප්‍රේල් 22 දින මණ්ඩලය වෙතින් ඉල්ලා ඇත.

• උමා ඔය ජලවිදුලි බලාගාරය ඉදිකිරීම් අතරතුර ඇති වූ ගැටළු (පීඩන උමග තුළට ජලය ඇතුළු වීම) සහ සමාජ ගැටලු හේතුවෙන් ප්‍රමාදවිය. ව්‍යාපෘතිය මහවැලි සංවර්ධන සහ පරිසර අමාතයාංශයේ විෂය පථයට අයත් වේ. වර්තමාන ඇස්තමේන්තු වලට අනුව, විදුලි බලාගාරය 2021 දී ආරම්භ කිරීමට අපේක්ෂා කෙරේ.

• සුළං බලාගාර ටෙන්ඩර් කිරීම සහ ප්‍රදානය කිරීම හේතුවෙන් ඉදිකිරීම් ප්‍රමාද විය.
විදුලිබල හිඟය පියවා ගැනීම සඳහා පහත විස්තර කර ඇති අනුමැතියන්ට

| | | |
|---|---|---|
| | අනුව පහත දැක්වෙන බලාගාර මෙහෙයවන ලදි.<br><br>• ප්‍රධාන විදුලි බලාගාර ක්‍රියාත්මක වන තුරු Furnace Oil fired විදුලි බලාගාර2019 දී විදුලි ඉල්ලුම සපුරාලීම සඳහා මෙගාවොට් 100ක ධාරිතාවක් කෙටිකාලීන පරිපූරක බලයක් ලෙස ලබා ගන්නා ලදි. අංක 19/0173/113/001 දරණ කැබිනට් පත්‍රයට අනුව 2019 ජනවාරි 14 දින කැබිනට් අනුමැතිය ලබා දෙන ලදි. මෙම විදුලි බලාගාර මඟින් රු. බිලියන 5.06 ක වියදමින් ගිගාවොට් පැය 142.13 ක් 2019 දී උත්පාදනය කර තිබේ.<br><br>• ඒස් පවර් මාතර, ඒස් ඇඹිලිපිටිය සහ ඒෂියා පවර් සමඟ මෙගාවොට් 171 ක සමුච්චිත ධාරිතාවක් සඳහා වන කල් ඉකුත් වූ විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් (PPA), විදුලි ඉල්ලුම් අවශ්‍යතාව සැපයීම සඳහා 2021 දක්වා දීර්ඝ කරන ලදි. අංක 18/0525/727/014/TBR දරන කැබිනට් පත්‍රයට අනුව 2018 මාර්තු 27 දින කැබිනට් අනුමැතිය ලබා දෙන ලදි. මෙම බලාගාර තුනෙන් රු.බිලියන 17.15 ක වියදමින් ගිගාවොට් පැය 592.86 ක් 2019 දී උත්පාදනය කර ඇත. | |
| (ඉ) 2017 අප්‍රේල් මාසයේ උතුරු වසන්තය ව්‍යාපෘතිය යටතේ 2014 දී හඳුනාගත් රු.39,551,696 ක තොග හිඟය සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන ශාඛාව විසින් විශේෂ පරීක්ෂණයක් පවත්වා තිබුණි. කෙසේ වෙතත්, මෙම වාර්තාවේ දිනය වන විටත් රු. 39,551,696 ක් වූ මුළු හිඟයෙන් රු.2, 510,056 ක හිඟයට වගකිව යුතු නිලධාරියාට එරෙහිව විනය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව විසින් 2015 දී ත්‍රිකුණාමලයේ මහේස්ත්‍රාත් උසාවියේ වෙනත් නිලධාරියෙකුට එරෙහිව නඩුවක් (නඩු අංක B / | උතුරු වසන්ත ව්‍යාපෘතිය යටතේ 2014 දී හඳුනාගත් රු. 39,551,696 ක තොග හිඟය හඳුනාගෙන ඇත.<br>ඉහත රු.39,551,696 ශේෂයන් දෙකකින් සමන්විත වේ. එනම් පිළිවෙලින් තොග හිඟය රු .2, 510,056 ක් සහ තොග හිඟය රු.37,041,640 ක් වේ. | වංචා පිළිබඳ විමර්ශන සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු අතර, මණ්ඩලය වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

1164/15) ගොනු කර තිබුණි . තවද, නඩුවේ වර්තමාන තත්ත්වය පිළිබඳ තොරතුරු විගණනය සඳහා ලබා දී නොමැත.

තොග හිඟය රු.2,510,056

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (එන්පී) විසින් 2017 මැයි 04 දිනැති අංක NP/DGM/HRO/Inquiry දරන ලිපිය මඟින් කමිටුවක් පත් කර ඇති අතර කමිටු වාර්තාව 2019 ඔක්තෝබර් 03 දින නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (එන්පී) වෙත ඉදිරිපත් කර ඇත. ඒ අනුව, **2019** ඔක්තෝබර් **09** දිනැති හා අංක. NP/DGM/HRO/Inquiry දරන ලිපියෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (එන්පී) විසින් ගබඩා භාරකරු වන ජේ.ඒ.එම්. අසංක ජයකොඩි මහතාගෙන් (පුද්ගලික ලිපි ගොනු අංක. **37432)** රු.2,510,056.88 ක් වන තොග හිඟය (මණ්ඩල ගාස්තු ඇතුළුව) අයකර ගැනීම සඳහා උපදෙස් ලබා දී ඇත. ගබඩා භාරකරු 2019 ඔක්තෝම්බර් මාසයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (එන්සීපී) වෙත මාරු කර ඇති අතර ඔහුගෙන් අයකර ගත යුතු මුදල ( රු. මිලියන 2.5 ) වෙනත් ලැබිය යුතු දේ යටතේ සටහන් කර ඇත. 2019 නොවැම්බර් 28 දිනැති DGM (C&C)/ DD1/ HRO / Admn/ 10 දරන ලිපියෙන් අතිරේක සාමාන්‍යාධිකාරි (DD1) විසින් සේවකයාගෙන් මෙම මුදල අය කර ගන්නා ලෙස උපදෙස් දී ඇත. කෙසේ වෙතත්, ජයකොඩි මහතා 2020 ජනවාරි 06 දිනැති ඔහුගේ ලිපියෙන් විධිමත් පරීක්ෂණයක් පවත්වන මෙන් ඉල්ලා සිටි අතර ඒ අනුව චෝදනා පත්‍රයක් නිකුත් කරන ලදී.

මීට අමතරව, 2020 සැප්තැම්බර් 03 දිනැති අංක AGM (DD1)/ DGM (C&C) /HRO /DI/162 දරන ලිපිය මඟින් සහකාර සාමාන්‍යාධිකාරි (DD1) විසින් විධිමත් විමර්ශන තීරණයට අනුව වාරික 180 කින් හිඟය පියවා ගැනීමට උපදෙස් දී ඇත.

| | | |
|---|---|---|
| | තොග හිඟය රු.37,041,640<br><br>මේ සම්බන්ධයෙන් මණ්ඩලයේ නීති නිළධාරී විසින් රිවඩ්සන් ප්‍රොජෙක්ට්ස් ( පුද්ගලික ) සමාගමට, අමුද්‍රව්‍ය සැපයීමෙන් තොරව රු . 22,584,800 ක් වංචනික ලෙස අත්පත් කර ගැනීම නිසා මෙම සමාගමෙන් මණ්ඩලයට අයවිය මුදලට සියයට **25** ක මණ්ඩල ගාස්තුද ඇතුළත්ව රු . 28,231,000 ක් අයකර ගැනීම සඳහා එන්තර වාසියක් නිකුත් කර ඇත. මීට අමතරව, අලාභයට එරෙහිව තවත් ගැලපීම් හඳුනා ගැනීම සඳහා කඩිනම්ව තවත් තොග ද්‍රව්‍ය සත්‍යාපන සිදු කරන ලදි. ඒ අනුව, යම් ගැලපීම් කළ පසු අලාභය රු. මිලියන 8.3 ක් දක්වා අඩු වී ඇත. මේ වන විට, අභ්‍යන්තර පරීක්ෂණය අවසන් කර ඇති අතර ඒ අනුව ගබඩා භාරකරු වන යූ.පී. උදාරා ගුණරත්න මහතාට (පු.ලි.අංක 37475) එරෙහිව විනය ක්‍රියාමාර්ග ගනු ඇත. තවද, අංක බී/1164/15 දරන නඩුව ත්‍රිකුණාමල මහේස්ත්‍රාත් අධිකරණයේ විභාග වෙමින් පවතී. | |
| (ඊ) විධිමත් විමර්ශනය අවසන් වී තිබියදීත්, වත්කම් කළමනාකරණ අංශයේ (බලාගාරය) 2006 නොවැම්බර් 20 සිට 2012 පෙබරවාරි 20 දක්වා කාලය තුළ සිදුවී ඇති රු. 3,674,861 ක තොග හිඟයට වගකිව යුතු පුද්ගලයාට එරෙහිව මණ්ඩලය විසින් 2018 අගෝස්තු 16 වන දින දක්වා කඩිනම් පියවර ගෙන නොතිබුණි. තවද, එම සේවකයාම මණ්ඩලයේ වෙනත් කාර්යාලයක වංචාවක් සිදු කර ඇති අතර, ඉහත වංචාවට පෙර සිදු වූ වංචාවේ වටිනාකම ලෙස රු. **99, 155** ක් අය කර ගැනීමෙන් පසු ඔහුගේ රාජකාරිය අවසන් කර ඇත. | අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණය) විසින් තොග හිඟය පිළිබඳ විමර්ශනය කිරීමට නව කමිටුවක් පත් කර ඇති අතර එම වාර්තාවට අනුකූලව පියවර ගනු ලැබේ. | වංචා පිළිබඳ විමර්ශන සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු අතර, මණ්ඩලය වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (උ) විමර්ශනය සඳහා පත්කළ කමිටුව නිර්දේශ කර පරිදි අලාභ අයකර ගැනීමෙන් තොරව රු.3,789,893 ක තොගය හිඟය සඳහා වගකිය යුතු නිලධාරියකුට 2011 ඔක්තෝබර් | අතිරේක සාමාන්‍යාධිකාරී (වත්කම් කළමනාකරණය) විසින් තොග හිඟය පිළිබඳ විමර්ශනය කිරීමට නව කමිටුවක් පත් කර ඇති අතර එම | වංචා පිළිබඳ විමර්ශන සැලකිය යුතු කාල සීමාවක් තුළ සිදු කළ යුතු |

| | | |
|---|---|---|
| 15 වන දින විශ්‍රාම යාමට අවසර දී තිබුණි. තවද, කිසිදු ක්‍රියාමාර්ගයක් ගැනීමෙන් තොරව ඉහත සඳහන් ප්‍රමාණාත්මක මුදල ගිණුම් පොත්වල පැවතුණි. විශ්‍රාම ගැනීමට අවසර දුන් පැහැර හරින ලද නිලධාරියාට එරෙහිව පියවර නොගෙන මෙම මුදල කපා හැරීමට මණ්ඩලය කටයුතු කරමින් සිටී. | වාර්තාවට අනුකූලව පියවර ගනු ලැබේ. | අතර, මණ්ඩලය වෙත සිදුවන පාඩු වළක්වා ගැනීම සඳහා විමර්ශන වාර්තාව මත වහාම විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**3. 3** මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය (SORP) දීර්ඝ කාලයක් තිස්සේ යාවත්කාලීන කර නොතිබුණි. | ජ්‍යෙෂ්ඨ විධායකයින් සහ කනිෂ්ඨ විධායකයින් සම්බන්ධ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය වෙළුම් දෙකක් දැනටමත් මණ්ඩල සමාජිකයින්ගේ අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. අනෙකුත් කාර්ය මණ්ඩලයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය සමාලෝචනය කරමින් පවතින අතර ඒවා හැකි ඉක්මනින් මණ්ඩල සමාජිකයින්ට ඉදිරිපත් කරනු ලැබේ. | බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම සඳහා කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) මානව සම්පත් අංශයේ ප්‍රධාන තනතුර වුවද, එම තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද, බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමයේ නිශ්චිතව දක්වා නොමැති අතර තනතුරු වෙනත් සේවාවන් සඳහා විවෘතව තබා ඇත. (විශේෂයෙන් විදුලි ඉංජිනේරුවන් සඳහා) | ප්‍රධාන තනතුරු මඟින් සපුරා ගැනීමට අවශ්‍ය අධ්‍යයන සුදුසුකම් සහ වෘත්තීය සුදුසුකම් ඇතුළත් වේ. තවද, මානව සම්පත් හෝ ව්‍යාපාර පරිපාලන ක්ෂේත්‍රවල පශ්චාත් උපාධියක් ලබා ඇති පළමු පන්තියේ විදුලි ඉංජිනේරුවන්ගෙන් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (පිරිස්) තෝරා ගනු ලැබේ. | දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සුදුසුකම් හා පළපුරුද්ද බඳවා ගැනීමේ යෝජනා ක්‍රමයට ඇතුළත් කළ යුතුය. |
| (ඇ) පවත්නා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය ට අනුව, මානව සම්පත් නිලධාරීන්ගේ (HRO) සමස්ත කාර්ය මණ්ඩලයෙන් සියයට 50 ක් බාහිරින් පුරවා ඇති අතර එම ප්‍රතිශතය වසරින් වසර ක්‍රමයෙන් සියයට 85 දක්වා වැඩි කිරීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, මණ්ඩලයේ ඉතිහාසයේ දීර්ඝ කාලයක් පුරා ප්‍රාදේශීය ප්‍රධානීන්ගේ කාර්යයන් ඉංජිනේරුවන් දෙදෙනෙකු විසින් ආවරණය කරන ලද බැවින් උසස්වීම් යෝජනා ක්‍රමයේ | ලබා දී ඇති නිර්දේශයට අනුගත වීම සඳහා, මේ වන විට සාකච්ඡාවට භාජනය වෙමින් පවතින විශාල ව්‍යුහාත්මක වෙනස්කම් මණ්ඩලය තුළ සිදු කළ යුතුව ඇත. | බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් මාර්ගයක් ලබා දීම සඳහා බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සංශෝධනය කළ යුතුය. |

| | | |
|---|---|---|
| බාහිරව බඳවා ගන්නා සේවකයින් සඳහා පැහැදිලි උසස්වීම් මාර්ගයක් නිරීක්ෂණය නොවීය. | | |
| (ඇ) මානව සම්පත් කළමනාකරු (HRM) සහ මානව සම්පත් නිලධාරී (HRO) ඍජුවම බඳවා ගැනීම සඳහා අවශ්‍ය පළපුරුද්ද වන්නේ සේවකයින් 100 කට වැඩි සංඛ්‍යාවක් සිටින ආයතනයක මානව සම්පත් ක්ෂේත්‍රයේ වසර 06 කි. මණ්ඩලය තුළ හැසිරවීමට අවශ්‍ය කාර්ය මණ්ඩල ශක්තියට සාපේක්ෂව ඉහත පළපුරුද්ද ප්‍රමාණවත් නොවන බව නිරීක්ෂණය විය. | ලබා දී ඇති නිර්දේශය ජ්‍යෙෂ්ඨ විධායකයින්ගේ නව බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රමය වෙත ඇතුළත් කර ඇති අතර එය මණ්ඩල සමාජිකයින්ගේ අනුමැතිය සඳහා දැනටමත් ඉදිරිපත් කර ඇත. | සංශෝධිත බඳවා ගැනීමේ යෝජනා ක්‍රමය සඳහා අනුමැතිය වහාම ලබා ගත යුතුය. |
| (ඉ) නීති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන තනතුර වන ප්‍රධාන නීති නිලධාරී තනතුර 2014 ජුනි 04 සිට පුරප්පාඩු වී ඇත. | බාහිර බඳවා ගැනීමේ පදනම මත සුදුසු ප්‍රධාන නීති නිලධාරී බඳවා ගැනීමට මණ්ඩල සමාජිකයින් තීරණය කර ඇති අතර මේ වන විට අදාළ කටයුතු සිදු වෙමින් පවතී. | සංවිධානයේ මෙහෙයුම් ඵලදායීව හා කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා කෙටි කාලයක් තුළ ප්‍රධාන තනතුරු පිරවිය යුතුය. |